# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2018

**වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදාකළමනාකරණ අමාත්‍යාංශය**
**විද්‍යා මාවත - කොළඹ 07.**

# පෙරවදන

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛණ අංක 402 මඟින් ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව සකස් කොට ඇත.

මෙම වාර්තාවේ I කොටස මඟින් අමාත්‍යාංශයේ පොදු තොරතුරු සමඟ සමස්ත මූල්‍ය ප්‍රගතිය ද අමාත්‍යාංශයේ අනෙකුත් අංශයන් විසින් 2018 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා සිදුකරන ලද කාර්යයන් පිළිබඳව ද තොරතුරු ඉදිරිපත් කර ඇති අතර, මෙම වාර්තාවේ II කොටසින් ඉදිරිපත් කරනු ලබන්නේ අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ පවතින ආයතනයක් වන ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානයේ 2018 වර්ෂය තුළ සිදුකරන ලද කාර්යයන්හි කාර්යසාධනයයි.

# හැඳින්වීම

ආපදා කළමනාකරණ විෂය වඩාත් වැදගත් වීමට හේතුවූ ප්‍රධාන සාධකය වුයේ ශ්‍රී ලාංකීය ජනතාවට මින් පෙර අත්දකින්නට නොලැබුණු ආකාරයේ සිදුවීමක් වූ වර්ෂ 2004 දෙසැම්බර් මස 26 වන දින බලපෑ සුනාමි ව්‍යසනයෙන් තිස්පන්දහසකට (35000) අධික ජීවිත සංඛ්‍යාවක් අහිමි වීමය. එම ව්‍යසනයෙන් ලක්ෂ 5කට අධික ජනතාව අභ්‍යන්තර අවතැන් වූවන් බවට පත්විය.

සිදු වූ ජීවිත හානි, ආර්ථික පසුබෑම සහ ඉන් සමාජයට වූ බලපෑම සම්බන්ධයෙන් සුහසාධන කටයුත්තක් සේ පැවති ආපදා කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් හා නීතිමය ව්‍යුහයක අවශ්‍යතාවය ඉස්මතු විය. ඒ අනුව මෙවැනි ව්‍යසනයන්ට සාර්ථකව මුහුණදීමට අවශ්‍ය ආයතනික හා නීතිමය ව්‍යුහය නිර්ණය කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් ස්ථාපිත කරන ලදී. එම තේරීම් කාරක සභාවේ නිර්දේශයන්ට අනුව 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලදී.

ඒ අනුව 2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනතින් ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් ස්ථාපිත කරන ලදී. එම ආයතන තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා වර්ෂ 2006 ක් වූ පෙබරවාරි මස 20 වෙනි දින නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ආපදා කළමනාකරණ හා මානව හිමිකම් පිළිබඳ කැබිනට් අමාත්‍යාංශය ස්ථාපිත කරන ලද අතර, 2010 අප්‍රේල් මස 30 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ලෙස නම් කොට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය අමාත්‍යාංශය යටතට ගෙනෙන ලදි. නැවත එය 2018.05.01 දිනැති අංක 2069/17 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වශයෙන් නම් කරන ලදී.

ආපදා කළමනාකරණයේ දී අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය , කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යන ආයතන මගින් අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන් සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා ආපදාවක් වීමට පෙර ආපදා අවස්ථාවේ දී සහ ආපදාවලින් පසුව ද මහත් සේවයක් ඉටුකරනු ලැබේ. මේ නිසා ආපදාවලින් ජන ජීවිත , දේපල සහ සේවා සුරක්ෂිත වීමත්, ප්‍රත්‍යස්ථ සමාජයක් උදෙසා ප්‍රජා සුරත්ෂිතභාවය තහවුරු කිරීමත්, පශ්චාත් ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහාත් පහසුකම් සැපයීම සිදුකරනු ලබයි.

අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය සහ මාර්ගෝපදේශකත්වය යටතේ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් පහත සඳහන් කාර්යයන් පසුගිය වසර පුරා ක්‍රියාත්මක කරන ලදී.

- ✓ **විපතට පත් ජනතාව සඳහා අවශ්‍ය සහන සැලසීම**
- ✓ **ආපදා වලින් පිඩාවට පත්වන ජනතාව වෙනුවෙන් ව්‍යාපෘති හදුනා ගැනීම, සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම (ආපදා ප්‍රත්‍යස්ථ නිවාස ඉදි කිරීම ආදිය)**
- ✓ **ස්වාභාවික මෙන්ම මිනිසා විසින් නිර්මිත ආපදාවලින් පීඩාවට පත් ජනතාවගේ ජීවනෝපායන් සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් කරනු පිණිස පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**
- ✓ **නියඟයෙන් වන පීඩා අවම කිරීම සඳහා ජල සැපයුම් හා නියං සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**
- ✓ **ආපදා තත්ත්වයන් පිළිබඳ දත්ත රැස් කිරීම සහ තොරතුරු ප්‍රචාරය කිරීම.**
- ✓ **ආපදා වාතාවරණයන්ට මුහුණ දෙන ආකාරය සහ සහන යාන්ත්‍රණ පිළිබඳව රාජ්‍ය නිලධාරීන් සහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.**
- ✓ **හදිසි ආපදා තත්ත්වයකදී සහන මෙහෙයුම සම්බන්ධීකරණය කිරීම.**
- ✓ **කාර්ය-සම්පාදන සේවාවන් සැපයීම.**

## දැක්ම

"සුරක්ෂිත ශ්‍රී ලංකාවක්"

## මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන්නා වූ ආපදා වලින් ඇතිවන අහිතකර බලපෑම් ඵලදායි ලෙස වැළැක්වීම සහ අවම කිරීම තුළින් සමෘද්ධිමත් සහ අභිමානවත් ජන ජීවිතයක් සඳහා පහසුකම් සැපයීම.

## අරමුණු

- **ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.**
- **පූර්ව අනතුරු ඇඟවීමේ සහ ප්‍රචාරණය කිරීමේ යාන්ත්‍රනය ක්‍රියාත්මක කිරීම.**
- **සියළු ස්ථර සඳහා ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.**
- **සංවර්ධන සැලසුම් සඳහා ආපදා අවදානම අවම කිරීමේ ක්‍රියාදාමයන් අනුගත කිරීම.**
- **සංවර්ධන සැලසුම් ක්‍රියාවලිය සඳහා බලපෑම් තක්සේරුකරණය අනුගත කිරීම.**
- **ආපදා අවදානම අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් එම ප්‍රදේශ ආපදාවන්ට ලක්වීම අවම කිරීම.**
- **නායයෑම් අවදානම් තක්සේරුකරණය සහ සහතික නිකුත් කිරීම**
- **ආපදා වලින් විපතට පත් වූවන් සඳහා සහන සැපයීම**
- **ආපදා මූලික පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්**
- **පශ්චාත් ආපදා පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණය**

## කාර්යයන්

මෙම අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා 2015 සැප්තැම්බර් 21 නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශය වෙත පහත සඳහන් කාර්යයන් පවරා ඇත.

- ආපදා කළමනාකරණ විෂයයට සහ ඊට අදාල දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති,වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම සහ ඇගයීම.

- ස්වාභාවික විපත් හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විපත් ලිහිල් කිරීම , ප්‍රතිචාර දැක්වීම, ප්‍රතිසාධනය හා සහන සැලසීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා කළමනාකරණය.
- ජාතික ප්‍රතිපත්ති මත පදනම් වූ ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම හා ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සැකසීම.
- ව්‍යසන ලිහිල් කරලීම, ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රතිසාධනය පිළිබඳ විදේශීය ආධාර ව්‍යපෘති ආරම්භ කිරීම හා සම්බන්ධීකරණය.
- ඉහත කාර්යභාරයන් නිසි වේලාවට ක්‍රියාත්මකවීම සහතික කරගැනීම පිණිස අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන , දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණය.
- පාරිසරික අවදානම් වලට ඔරොත්තු දිය හැකි තාක්ෂණික ප්‍රමිතියකින් යුත් නිවාස තැනීම ප්‍රවර්ධනය කිරීම.
- නිවාස හා ඉදිකිරීම් යන අංශ සඳහා යෝග්‍ය තාක්ෂණයට අදාල පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගැන්වීම.
- කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ සිදුකිරීම.
- ස්වාභාවික ව්‍යසන පෙරයීම් කිරීම හා ඒ පිළිබඳ අදාළ අංශ දැනුවත් කිරීම.
- ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසනවල දී ගලවාගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.
- ජාත්‍යන්තර මානුෂීය සහනසේවා වැඩසටහන් සම්බන්ධීකරණය.
- ආපදා කළමනාකරණ විෂයට අදාල දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයන්ට අදාළ කටයුතු අධීක්ෂණය කිරීම.

# පටුන

I කොටස


01 පාලන කටයුතු 01-04

02 සැලසුම් හා සංවර්ධන කටයුතු 04 - 09


03 ගිණුම් කටයුතු /ප්‍රසම්පාදන කටයුතු 10 -11

04 අභ්‍යන්තර විගණන කටයුතු 12-14


II කොටස


ජාතික ආපදා සහනසේවා කටයුතු 16 - 30

විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව 31 - 37


ලේකම්
අතිරේක ලේකම් (පාලන හා මුදල්)
අතිරේක ලේකම් (සංවර්ධන හා ආපදා සහනසේවා)
ප්‍රධාන මූල්‍ය නිලධාරි
අධ්‍යක්ෂ (කළමනාකරණ)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)
අධ්‍යක්ෂ සැලසුම්
අධ්‍යක්ෂ (ආපදා සහන)
ප්‍රධාන ගණකාධිකාරි
අභ්‍යන්තර විගණක
සහකාර අධ්‍යක්ෂ (කළමනාකරණ)
නීති නිලධාරි
සහකාර ලේකම්
සහකාර ලේකම්
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
අතිරේක අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ආපදා සහන)
ගණකාධිකාරි
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්තක
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි
සහායක කාර්ය මණ්ඩලය
සහායක කාර්ය මණ්ඩලය
සහායක කාර්ය මණ්ඩලය
සහායක කාර්ය මණ්ඩලය
සහායක කාර්ය මණ්ඩලය
සහායක කාර්ය මණ්ඩලය

## 01. පාලන කටයුතු

| අංකය | තනතුරු නාමය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය සේවක මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ලේකම් | 01 | 01 | 00 |
| 02 | අතිරේක ලේකම් | 02 | 02 | 00 |
| 03 | ප්‍රධාන මූල්‍ය නිලධාරි | 01 | 01 | 00 |
| 04 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 | 01 | 00 |
| 05 | ප්‍රධාන ගණකාධිකාරි | 01 | 01 | 00 |
| 06 | අධ්‍යක්ෂ (කළමනාකරණ) | 01 | 01 | 00 |
| 07 | අධ්‍යක්ෂ (සැලසුම්) | 01 | 01 | 00 |
| 08 | සහකාර ලේකම් | 02 | 01 | 01 |
| 09 | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | 01 | 01 | 00 |
| 10 | සහකාර අධ්‍යක්ෂ (කළමනාකරණ) | 01 | 01 | 00 |
| 11 | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 | 00 | 01 |
| 12 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 | 01 | 00 |
| 13 | නීති නිලධාරි | 01 | 01 | 00 |
| 14 | පරිපාලන නිලධාරි | 01 | 01 | 00 |
| 15 | ලේකම් ගේ සම්බන්ධීකරණ ලේකම් (තාවකාලික) | 01 | 00 | 01 |
| 16 | භාෂා පරිවර්තක | 02 | 01 | 01 |
| 17 | සංඛ්‍යා ලේඛන නිලධාරි | 01 | 01 | 00 |
| 18 | තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන නිලධාරි | 01 | 01 | 00 |
| 19 | සංවර්ධන නිලධාරි | 39 | 22 | 17 |
| 20 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 20 | 18 | 02 |
| 21 | තාක්ෂණ නිලධාරි | 01 | 01 | 00 |
| 22 | තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන සහකාර | 01 | 01 | 00 |
| 23 | කැමරා ක්‍රියාකරු (සහායක) | 01 | 01 | 00 |
| 24 | රියදුරු | 15 | 11 | 04 |
| 25 | කාර්යාල කාර්ය සහායක | 15 | 14 | 01 |
| එකතුව | | 113 | 85 | 28 |

## 1.1 ස්ථාන මාරුවීම් / විශ්‍රාම ගැන්වීම්

2018 වර්ෂයේ ජනවාරි මස සිට එම වර්ෂයේ දෙසැම්බර් මස දක්වා අමාත්‍යාංශයේ සේවක මහත්ම මහත්මීන් දොලොස්දෙනෙකු (12) වෙනත් සේවා ස්ථාන සඳහා මාරුවීම් ලැබ ඇති අතර, අමාත්‍යාංශය වෙත ස්ථානමාරු ලැබ පැමිණි සේවක මහත්ම මහත්මීන් ගණන හතරකි (04) රාජ්‍ය කළමනාකරණ සහකාර නව පත්වීම් ලබා පැමිණි ගණන හතකි (07).

**තවද, අමාත්‍යාංශයේ ලේකම් ධූරය දරමින් සිටි එම්.ජී.කේ.එම්.ප්‍රනාන්දු මහතා 2018 වසරේ විශ්‍රාම ගන්නා ලදි.**

## 1.2 . ව්‍යසන කළමනාකරණය පිළිබඳ ජාතික සභාවේ රැස්වීම් හා අදාළ කාර්යයන්හි ප්‍රගතිය.

2018.04.05 දින පැවති ව්‍යසන කළමනාකරණය පිළිබඳ ජාතික සභාවේ 13වන රැස්වීම් සටහනේ 06 කරුණ අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් යොමු කර ඇති CAA/CP/MIWRDM හා 2018.07.26 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති පරිදි 350ml, 500ml, 750ml, 1L, 1.5L හා 5L ප්‍රමාණයෙන් යුත් පානීය ජල බෝතල සඳහා පාලන මිලක් නියම කිරීමට කටයුතු යොදා ඇත.

තව ද ඒ සම්බන්ධව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අධිකාරි පනතේ විධිවිධාන වලට අනුව ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ ආයතනය විසින් පානීය ජල බෝතල් සඳහා නිකුත් කර ඇති ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල නොවන ජල බෝතල් විකිණීම සම්බන්ධයෙන් වෙළෙඳුන්ට එරෙහිව අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයන්හි නඩු පවරා විශාල නඩු ප්‍රමාණයක් අවසන් කර ඇති බවත්, පාරිභෝගික ජනතාවට ප්‍රමිති සහගත පානීය ජල බෝතල් මිලදී ගැනීමට කටයුතු කරන ලෙස පාරිභෝගික කටයුතු පිළිබඳ සංවර්ධන අධිකාරිය මගින් දිස්ත්‍රික් ප්‍රධානීන් වෙත උපදෙස් ලබා දී ඇති බවත් විවිධ ජල බෝතල් ප්‍රමාණ සඳහා අදාළ උපරිම මිල ගණනය කර ඇති බවත් ඉදිරියේ දී ගැසට් පත්‍රයක් මගින් එම මිල ගණන් ගැසට් කිරීමට කටයුතු කරන බවත් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අධිකාරිය මගින් දන්වා ඇත.

අදාළ රැස්වීම් සටහනේ 07 කරුණට අනුව කවුඩුල්ල වාන් ඇල ගොඩ දැමීම දැනට වර්ෂ කීපයක සිට කරගෙන එන බවත් එහි ප්‍රගතියක් මොරගහකන්ද ජලාශයේ සිට ඇලහැර අමුණ හරහා මින්නේරිය, කවුඩුල්ල, ගිරිතලේ හා කන්තලේ ජලාශ සඳහා ගෙන යා හැකි උපරිම ජල ධාරිතාව වඩා වැඩියෙන් රැගෙන යාමේ දී යෝධ ඇල පිටාර ගැලීම නිසා ගොවිතැන් හා දේපල ජලයෙන් යට වන බවත් එම නිසා යෝධ ඇලට ඇලහැර සිට දිය බෙදුම දක්වා විශාල ප්‍රමාණයක් ස්වාභාවික ඇලවල් එකතු වන බැවින් ප්‍රතිසංස්කරණයක් තුළින් ඇලෙහි ධාරිතාව වැඩි කිරීම ප්‍රායෝගිකව කළ නොහැකි බවත් පොළොන්නරුව වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ DI/PLN/W3/12 – 2017 හා 2018.08.08 දිනැති ලිපියෙන් දන්වා ඇත. තව ද ඒ බව දන්වමින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් DIAMIAM/PIDP (Gen) දරණ ලිපිය යොමු කර ඇත.

ව්‍යසන කලමනාකරණය පිළිබඳ ජාතික සභා රැස්වීම් සටහනේ අංක 09 අනුව පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 08ක අත්පොම්ප නළ ළිං ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු පිළිබඳ ප්‍රගතිය පුත්තලම දිස්ත්‍රික් ලේකම්ගේ අංක DSP/ADM.4/DEV.1/01/03/V සහ 2018.09.14 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇති අතර ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත අනෙකුත් අත්පොම්ප නල ළිං ප්‍රතිසංස්කරණය සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත.

## 1.3. නීතිමය කටයුතු

අමාත්‍යාංශය විසින් සකස් කරන ලද සංශෝධිත පනත් කෙටුම්පත නීති කෙටුම්පත්කරු වෙත යොමු කර ඇත. ජාතික ගොඩනැගිලි පර් යේෂණ සංවිධාන පනත නීති කෙටුම්පත්කරු විසින් සකස් කොට නීතිපති ගේ අනුමැතිය ලබාගත් පසු පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

අමාත්‍යාංශය විසින් සිදුකරන ලද නීතිමය කටයුතු වශයෙන්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට එරෙහිව පවරා ඇති නඩු සඳහා 2018 වර්ෂය තුල 12 වතාවක් ශ්‍රේෂ්ඨාධිකරණයේ හා

අභියාචනාධිකරණයේ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පෙනී සිට ඇත. වෙනත් අධිකරණවල පවතින නඩු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කිරීම් හා අවශ්‍ය උපදෙස් ලබාදීම සිදුකර ඇත.

## 1.4 මහජන පැමිණිලි

අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතනයන්හි සේවාව අපේක්ෂාවෙන් මහජනතාව විසින් ඔවුන් ගේ ගැටළු සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කරන අතර, එම පැමිණිළි ඒ ඒ ආයතන වෙත යොමු කරමින් මහජනතාවගේ ගැටළු සඳහා විසඳුම් ලබාදීමේ සම්බන්ධීකරණ කටයුතු අමාත්‍යාංශය මඟින් ඉටුකරන අතර, 2018 වර්ෂය තුළ මහජන පැමිණිලි 1206 ක් ලැබී ඇත. එම පැමිණිලි අදාල ආයතන අංශ වෙත යොමු කිරීම සිදු කර ඇත.

## 1.5 අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධ කටයුතු

2018 වර්ෂය තුල දී අමාත්‍ය මණ්ඩල සංදේශ 24 ක් හා අමාත්‍ය මණ්ඩල සටහන් 02 ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, ඉන් අමාත්‍ය මණ්ඩල සංදේශ 18 ක් හා අමාත්‍ය මණ්ඩල සටහන් 02 ක් සඳහා තීරණ ලබා දී ඇත.

## 1.6. ඵලදායිතා / කළමනාකරණ වැඩසටහන

පංචවිධ සංකල්පයට අනුව කාර්යාලය පවත්වා ගැනීමේ වැදගත්කම සම්බන්ධව දේශනයක් පැවැත්වීමත් පැරණි ලිපිගොනු ලැයිස්තු ගත කොට ලේඛණාගාරයේ තැන්පත් කිරීමත් සිදුකොට ඇති අතර, මීට අදාලව දිනක පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

## 1.6. පුහුණු වැඩසටහන්

### 1.6.1. දේශීය

අමාත්‍යාංශයේ නිලධාරින්ගේ හැකියා වර්ධනය කිරීමේ අරමුණින් නිපුනතා සංවර්ධන ආයතනය, ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය, ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වැනි රජයේ අනුබද්ධ ආයතන වල දීර්ඝ කාලීන හා කෙටි කාලීන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් 39 දෙනෙකු යොමු කර ඇත.

මීට අමතරව 2018 වර්ෂයේ දී වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හතරෙහි නිලධාරීන්ගේ ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම , නිලධාරීන්ගේ ආතති කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබාදීමේ අරමුණින් හා කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම සඳහා කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ දී පවත්වන ලදි.

දෙවන භාෂා (දෙමළ) 1V මට්ටම සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මඟින් පැය 50 ක පාඨමාලාව සඳහා නිලධාරීන් 14 දෙනෙකු යොමු කරන ලදි.

### 1.6.2. විදේශීය

අමාත්‍යාංශය නියෝජනය කරමින් විදේශීය සමුළු, රැස්වීම්, සම්මන්ත්‍රණ පුහුණු වැඩමුළු 26 ක් සඳහා නිලධාරින් 14 දෙනෙකු සහභාගී වී ඇත.

## 1.7. ජාතික සුරක්ෂිත දිනය සැමරීම

අංක. අමප/15/1975/715/001-1 හා 2016.01.07 දිනැති "ජාතික සුරක්ෂිත දිනය සැමරීම 2015" මැයෙන් වන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව වාර්ෂිකව ජාතික සුරක්ෂිත දිනය සැමරීම සිදු කරන අතර, මෙවර ද එය අමාත්‍යාංශයට අයත් ආයතන 04 හි දායකත්වයෙන් දීප ව්‍යාප්තව වියදම් අවම කරගනිමින් සර්ව ආගමික වැඩසටහන් පැවැත්වීම සහ ආපදා අවම කිරීමේ , ආපදා පෙර සූදානම්, ආපදා අවස්ථාවක දී මහජනතාව කටයුතු කලයුතු ආකාරය හා රජය ට සහයෝගය දැක්විය හැකි ආකාරය , ආපදා අවස්ථාවන්හී දී මුහුණ දෙන ආකාරය වැනි අංශ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක කරන ලදි.

## 02. සැළසුම් හා සංවර්ධන කටයුතු

### 2.1. සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය

අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය සහ ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය විසින් දේශීය හා විදේශීය අරමුදල් භාවිතා කරමින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති සම්බන්ධීකරණය හා අධීක්ෂණ කටයුතු සංවර්ධන හා සැලසුම් අංශය මඟින් සිදුකරනු ලබයි. ඒ අනුව පහත සඳහන් කාර්යයන් ඉටුකරන ලදී.

2.1.2. 2018 වර්ෂයට අදාලව සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් 05 ක් ගරු ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. කාර්තුමය වශයෙන් ප්‍රගති සමාලෝචන සාකච්ඡා 03 ක් පවත්වා ඇත. මෙහිදී අනුබද්ධ ආයතනයන්හී හා අනෙකුත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමත් පසු විපරම් සිදු කිරීම තුළින් අපේක්ෂිත අරමුණු කරා ලඟාවීමටත් හැකියාව ඇතිවිය.

**2.1.3.** රජයේ අයවැයට අනුව අමාත්‍යාංශය වෙත වෙන්කරන ලද ප්‍රතිපාදන වලට අනුකූලව 2018 වර්ෂයට වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත 2017 වර්ෂයේ දෙසැම්බර් මස ඉදිරිපත් කල අතර, 2019 වර්ෂයට අදාල ක්‍රියාකාරි සැලැස්ම ද සකස් කර අදාල ආයතන හා අංශ වෙත යොමු කරන ලදී.

2.1.4. 2018 වර්ෂයට අදාලව සකස් කරන ලද ක්‍රියාකාරි සැලැස්මට අනුව අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන හතරෙහි ප්‍රගතිය කාර්තුමය වශයෙන් සකස්කර රජයේ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී.

2.1.5. රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 402 හි 241 ප්‍රකාරව 2017 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. එය 2018.05.25 දින තිරසර සංවර්ධන හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බව පාර්ලිමේන්තු සභා නායක කාර්යාලය මඟින් දැනුම් දී ඇත.

2.1.6. අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන මඟින් ක්‍රියාත්මක කරන ලද සියළුම ව්‍යාපෘතීන් හි ප්‍රගතිය ඇතුලත්ව සකස් කරන ලද ප්‍රගතිය 04 වන කාර්තුව දක්වා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලදී. ඊට අමතරව එම ප්‍රගතිය ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ද යොමු කරන ලදී. ශ්‍රී ලංකා මහබැංකුව මඟින් වාර්ෂිකව ඉල්ලීම් කරන ලද අමාත්‍යාංශයේ ව්‍යාපෘතීන් හි ප්‍රගතිය ඇතුලත් වාර්තාව ද අදාල ආයතනය වෙත යොමු කර ඇත.

2.1.7. ජනාධිපති කාර්ය සාධන බලකාය උතුරු නැගෙනහිර පළාත් සංවර්ධන අංශයෙන් ඉල්ලුම් කර තිබූ 2015-2018 වර්ෂයන්හි දී උතුරු නැගෙනහිර පළාතෙහි ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු ලබාදෙන ලදි.

2.1.8. 2019 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමු කරන ලදි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති යෝජනා 01 ක් ද ආපදා කළමණාකරන මධ්‍යස්ථානයේ ව්‍යාපෘති යෝජනා 7 ක් ද ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානයේ ව්‍යාපෘති යෝජනා 01 ක් ද ජාතික ගොඩනැඟිලි පර්යේෂණ මධ්‍යස්ථානයට අයත් ව්‍යාපෘති 10 (ව්‍යාපෘති 03 ක් විදෙස් ව්‍යාපෘති) ක් ද වශයෙන් ඉදිරිපත් කර ඇත.

2.1.9. 2018 – 2021 රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙතයොමු කරන ලදි.

2.1.10 2016 අප්‍රේල් මස 22 දින එක්සත් ජාතීන්ගේ සාංවිධානය සමඟ ඇතිකර ගන්නා ලද ගිවිසුමකට අනුව ශ්‍රී ලංකාව විසින් ගෝලීය දේශගුණ විපර්යාස අවම කිරීම සඳහා නායකත්වය ලබාදීම යටතේ මහවැලි සාංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මඟින් උපාය මාර්ගික ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක සැලසුම් ඇතුලත් වාර්තාවක් සකස් කරන ලද අතර, මෙම අමාත්‍යාංශය විසින් අලාභ සහ හානි (Loss and Damages) අංශය යටතේ අපේක්ෂිත ජාතිකමය නිර්ණය කරන ලද දායකත්ව 5 ක් හදුනාගෙන ඒ සඳහා ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ඇත. ඒ අනුව අදාල පාර්ශවකාර ආයතන ඇතුලත් සැලසුම් හා මෙහෙයුම් කමිටු රැස්වීම් වාර කීපයක් පවත්වා ඇත. වර්ෂ 2000 සිට 2015 දක්වා කාලසීමාවේ සිදුවූ ආන්තික කාලගුණික තත්ත්ව අවස්ථා 64 සම්බන්ධව සිදුවූ ආලාභ හා හානි සම්බන්ධ තොරතුරු රැස් කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවති. ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගතිය හා ඉදිරි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

## 2.2. සෙන්දායි රාමුව - 2015 - 2030

දේශගුණික විපර්යාස හේතුවෙන් සිදුවන ස්වාභාවික ව්‍යසන වැඩිවීමේ ප්‍රවනණතාවයක් මෑත කාලයේ දැකිය හැකි අතර, එයින් ඇතිවන බලපෑම ද සුළුපටු නොවේ. මෙම තත්ත්වයන් සලකා බලා ආපදා කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා විවිධ උපායමාර්ග ක්‍රියාත්මක කරන ලද අතර, ඒ සඳහා වූ කලාපීය හා ගෝලීය සම්මුතීන් විශේෂ තැනක් ගනී. 2005-2015 කාලසීමාව සඳහා ඇතිකරගත් හියුගෝ ක්‍රියාකාරි සැලැස්ම (HFA ) ප්‍රමුඛතාවයන් හතරක් මූලික කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද අතර, සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව ද සුවිශේෂ දායකත්වයක් සපයන ලදි.


හියුගෝ ක්‍රියාකාරි සැලැස්මෙන් හදුනාගත් අඩුපාඩු සහ උගත් පාඩම් සැලකිල්ලට ගනිමින් ආපදා අවධානම් කළමනාකරණය කෙරෙහි අවධානය යොමු විය. ඒ අනුව 2015 – 2030 කාලපරිච්ඡේදය සඳහා ඇති කරගත් ආපදා අවධානම අවම කිරීම සඳහා වූ සෙන්දායි රාමුව **(Sendai Frame work for Disaster Risk Reduction – SFDRR)** ක්‍රියාත්මක වෙමින් පවති. මෙම රාමුව ප්‍රමුඛතාවයන් 4 ක් යටතේ ගෝලීය ඉලක්ක 7 ක් සහ එහි සාර්ථකත්වය මැන බැලීම සඳහා වූ නිර්ණායක 32 ක් ඇතුලත් වූ ජාත්‍යන්තර සම්මුතියකි.

මෙම ක්‍රියාකාරි රාමුව ක්‍රියාත්මක කිරීමේ ශ්‍රී ලංකාවේ කේන්ද්‍රික ආයතනය (**Focal Point**) ලෙස රාජ්‍ය පරිපාලන සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය නම් කර ඇත. මේ වන විට අවශ්‍ය මූලික පියවරයන් ගෙන ඇති අතර,පාර්ශවකාර ආයතන හා එම ආයතනවල නියෝජිතයන් ද හඳුනාගෙන ඇත. මීට අමතරව මෙම ක්‍රියාකාරි සැලැස්ම මෙහෙයවනු ලබන **UNISDR** ආයතනයට අවශ්‍ය වාර්තා සපයා ඇති අතර එහි මෙහෙයුම් පද්ධතියට (**Monitoring System)** අවශ්‍ය 2015 /2016 හා 2017 යන වර්ෂවලට අදාල ආපදා හේතුවෙන් මියගිය පුද්ගල සංඛ්‍යාව , ආපදාවෙන් බලපෑමට ලක්වූ

පුද්ගල සංඛ්‍යාව යාවත්කාලීන කරන ලද අතර එම වර්ෂවල සිදු වූ අලාභ සහ හානි වටිනාකම සම්බන්ධයෙන් තොරතුරු රැස් කරමින් පවතී.

## 2.3. සංඛ්‍යාලේඛන ඒකකය

මෙම අමාත්‍යාංශය විසින් ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වෙත කරන ලද ඉල්ලීමකට අනුව සංඛ්‍යා ලේඛන නිලධාරි මහතෙකු 2018 වර්ෂයේ සිට මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත. ඒ අනුව එම ඒකකය මඟින් අමාත්‍යාංශයේ එදිනෙදා පාලන සහ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය නිල සංඛ්‍යාති ( ප්‍රාථමික සහ ද්විතික දත්ත සහ තොරතුරු) සම්පාදනය කරනු ලබන අතර, ආපදා අවදානම අවම කිරීම සඳහා වූ සෙන්දායි ජාත්‍යන්තර රාමුව , තිරසාර සංවර්ධන දර්ශක සහ වෙනත් ජාත්‍යන්තර ගිවිසුම් සහ එකඟතාවන්ගේ ප්‍රගතිය වාර්තා කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබාදීම සහ සෙන්දායි දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සිදුකරනු ලැබේ




ආපදා අවම කිරීම සඳහා වන සෙන්දායි රාමුවේ අන්තර්ජාලය මඟින් දත්ත ඇතුලත් පද්ධතියෙහි රූපරාමුවකි.

## 2.4. හදිසි පෙර සූදානම පිළිබඳ තාක්ෂණික සහාය - ලෝක ආහාර වැඩසටහන

2016 ඔක්තෝබර් මස අත්සන් තබන ලද පුළුල් ගිවිසුම යටතේ වාරිමාර්ග ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන හා එක්ව 2018 වසර සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කරන ලද අතර, එය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. ක්‍රියාකාරි සැලැස්ම ඉලක්ක ගත වී ඇත්තේ, ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම දියුණු කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාදීම , සහන නිලධාරීන් පුහුණු කිරීම, සජීවී දත්ත තොරතුරු නිරීක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම හා බලපෑමට ලක්විය හැකි හා බලපෑම අවබෝධ කර ගැනීම සඳහා තාක්ෂණික සහාය ලබාදීම යන කරුණු කෙරෙහිය.

වර්තමානයේ හදිසි සැලසුම් මෙහෙයුම්කරණයට අදාළව මෙම අමාත්‍යාංශය වෙත සහාය ලබාදීමේ ප්‍රධාන පාර්ශවකරුවෙකු ලෙස ලෝක ආහාර වැඩසටහන මඟින් ඒකාබද්ධ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කෙරෙන අතර, මේ සඳහා ජොෂ්ඨ හදිසි නිලධාරියෙකු හා ආපදා ප්‍රතිචාර විශේෂඥවරයෙකු අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත.

මෙම වැඩසටහන මඟින් හදිසි මෙහෙයුම් සැලසුම් කමිටුවක් ස්ථාපනය කර උපදේශනය හා වැඩිදියුණු කිරීම සිදුකරන ලද අතර, ජාතික කළමනාකරණ ක්‍රියාවලියක් ජාතික හදිසි මෙහෙයුම් පද්ධතිය තුළට ඇතුළත් කරමින් ජාතික හදිසි මෙහෙයුම් සැලස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අතිරේක මෙවලම් හඳුනාගෙන ඇත. මේ වන විට සංශෝධිත හදිසි මෙහෙයුම් සැලසුමෙහි කටයුතු අවසන් අදියරේ පවතින අතර, සම්මත මෙහෙයුම් ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම, සැලසුම්කර තිබීම හා මෙම සැලසුම් පරික්ෂා කිරීම සඳහා පෙරහුරු වැඩසටහන් 2019 වසරේ පළමු කාර්තුවේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා සම්මත වේගවත් හානි තක්සේරු කරන මෙවලම හඳුන්වා දී 2017 ගංවතුර ආපදා තත්ත්වය යටතේ පරික්ෂාවට ලක්කර ක්ෂේත්‍ර තහවුරු කිරීම සම්පූර්ණ කර ඇත. මෙය ආපදා තත්ත්වයන් යටතේ සිදුවන හානී තක්සේරු කිරීමට යොදාගත හැකි වැදගත් මෙවලමක් වන්නේය.පවතින නියං තත්ත්වය සමග අමාත්‍යාංශය විසින් නියං හානි තක්සේරුකරණය සිදුකිරීම සඳහා ලෝක ආහාර සංවිධානයේ සහාය ඉල්ලා සිටි අතර නියං හානි තක්සේරුව සම්පූර්ණ කර ඇත. සජීවී දත්ත තොරතුරු නිරීක්ෂණ පද්ධතිය හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය වැඩිදියුණු කොට ස්ථාපනය කර ඇති අතර, ආපදා ස්ථානයේ සිට සංස්ථාපිත තොරතුරු ලබා ගැනීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සමඟ වැඩිදියුණු කිරීම ක්‍රියාත්මක වේ. තීරණ ගැනීමේ ක්‍රමවේදය වඩාත් හොඳින් ඒකාබද්ධ කිරීම සඳහා අමාත්‍යාංශයේ නායකත්වයෙන් තාක්ෂණික කමිටුවක් ස්ථාපනය කර ඇත.

අවිනිශ්චිතතා සැලසුම්කරණය ජාතික සහන සේවා මධ්‍යස්ථානය වෙත හඳුන්වා දී එහි තෙවනි අදියර ලෙස 2018 ඊසාන දිග මෝසම් වර්ෂාව ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලදි. ලෝක ආහාර සංවිධානයේ තාක්ෂණික විද්‍යාඥයින් විසින් ජාතික සහන සේවා මධ්‍යස්ථානය හා එක්ව දිස්ත්‍රික්ක 17 ක සහන සේවා නිලධාරීන් සඳයා පුහුණු වැඩමුළු 6 ක් පවත්වන ලදී.

## 2.5. තොරතුරු කළමනාකරණය ඉහළ නැංවීම තුළින් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ප්‍රවාහය තුළට ගෝලීය පාරිසරික හා ආපදා අවදානම කළමනාකරණ එකඟතාවයන් අනුගත කිරීමේ ව්‍යාපෘතිය

තොරතුරු කළමනාකරණය ඉහල නැංවීම තුළින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ප්‍රවාහය තුළට ගෝලීය පාරිසරික හා ආපදා අවධානම කළමනාකරණ එකඟතාවයන් අනුගත කිරීමේ ව්‍යාපෘතිය 2017 වර්ෂයේදි ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද අතර 2018 වර්ෂයේ දෙසැම්බර් මස අවසන් කරන ලදී. එහිදි 98% පමණ හඳුනාගත් ක්‍රියාකාරකම් අවසන් කර ඇත. දත්ත පිළිබඳ දත්ත(Meta data) ඇතුලත් කරමින් සකස් කරන ලද වෙබ් අඩවිය අමාත්‍යාංශය වෙත භාරදීම හා දත්ත ඇතුලත් කිරීම පිළිබඳව හඳුනාගත් පාර්ශවකාර ආයතන පුහුණු කිරිමේ වැඩසටහන් 2019 වර්ෂයේ ප්‍රථම කාර්තුව තුලදි සිදු කිරිමට අපේක්ෂිතය.

ආපදා සහ පාරිසරික දත්ත තීරණ ගැනීමේ කාර්යය සඳහා භාවිතා කිරිමේ වැදගත්කම පිළිබඳව ගම්පහ සහ බදුල්ල දිස්ත්‍රික්කවල මහජනතාව, රාජ්‍ය නිළධාරින්, දේශපාලන අධිකාරිය, සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරිකයින් හා පුවත්පත් හා විද්‍යුත් මාධ්‍යවේදීන් දැනුවත් කිරිමේ වැඩසටහන් මාලාවක් පවත්වන ලදී.






දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව  ආරම්භ කිරීම



බදුල්ල වැලිමඩ මහ ජනතාව දත්ත භාවිතයේ වැදගත්කම පිළිබද දැනුවත් කිරීම



ප්‍රාදේශීය මාධ්‍ය වේදීන් දැනුවත් කිරීම සඳහා හපුතලේ පැවති වැඩසටහන

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව ඉතා සාර්ථක වු අතර එමඟින් දත්ත හා තොරතුරු මූලාශ්‍රයන් පවතින ආයතන පිළිබඳව වැඩි වැඩියෙන් විමසීම් සිදුකල අතර ඒ සඳහා අදාල දත්ත හා තොරතුරු පවත්වාගෙන යනු ලබන ආයතන පිළිබද විස්තර ඇතුලත් කරමින් අන්තර්ජාලය හරහා ප්‍රවිශ්ඨ විය හැකි දත්ත පිළිබද දත්ත ගබඩාවක් ඇතිකරන ලදී.(Meta data portal).

2.5.1. බදුල්ල දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආයතන අතරේ දත්ත හුවමාරු කිරිමේදී/ දත්ත භාවිත කිරිමේදී ඇතිවන ගැටළු හදුනාගෙන ඇති අතර එම ගැටළු නිරාකාරණය කිරීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

2.5.2. දත්ත පිළිබද දත්ත ඇතුළත් කරමින් සකස් කරනු ලබන වෙබ් අඩවිය (දත්ත ගබඩාව) .(Meta data portal) යාවත්කාලීන කිරීම සඳහා හදුනාගත් පාර්ශවකාර ආයතන සඳහා අවශ්‍ය පරිගණක හා අනෙකුත් උපාංග මිලදී ගෙන ආයතන තිස් තුනක් (33) අතරේ බෙදා හරින ලදී.

2.5.3 බදුල්ල, රත්නපුර, ගම්පහ සහ මාතලේ දිස්ත්‍රික්කවල තෝරාගත් පාසල් වල ළමුන් සඳහා ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් අධ්‍යාපන අමාත්‍යාංශය සමග එක්ව සංවිධානය කරන ලද අතර එහි දිස්ත්‍රික් මට්ටමේ තරග 2018 සැප්තැම්බර් මස 15 වන දින පවත්වන ලදී. දිස්ත්‍රික් ජයග්‍රහකයන් සමග අවසන් මහ තරගය ඔක්තෝම්බර් මසදී 06 වන දින මෙම අමාත්‍යාංශ ශ්‍රවනාගාරයේදී පවත්වන ලද අතර, බදුල්ල මධ්‍යමහා විද්‍යාලය විසින් 9ශූරතාවය හිමිකර ගන්නා ලදී. මෙමගින් පාසල් දරුවන් සඳහා තමන් අධ්‍යාපනය ලබන පරිසරය සමග ජීවත්වීමේ දී පරිසරය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම හා එමගින් ඉදිරියේ දී ඇතිවිය හැකි ආපදා තත්ත්වයන් කල් ඇතිව හඳුනාගැනිමේ හැකියාව වර්ධනය කිරීම අරමුණ විය.

2.5.4. මෙම ව්‍යාපෘතිය යටතේ පාරිසරික හා ආපදා පිළිබඳ දත්ත භාවිතා කරමින් පුහුණු පාඨමාලාවන් පැවැත්වීම සඳහා උපකාරකර ගැනිම සඳහා පුහුණු මොඩියුලයන් (Training Modules) 04 ක් සකස් කරන ලදී.

2.5.5. ගම්පහ දිස්ත්‍රික්කයේ සැලැසුම් නිළධාරින්ද ඇතුලත්ව දත්ත හා තොරතුරු තීරණ ගැනිමේ ක්‍රියාවලියට යොදා ගැනිමේ වැදගත්කම පිළිබඳව රජයේ නිළධාරින් දැනුවත් කිරිමේ වැඩසටහන් පවත්වන ලදී.

2.5.6. මහවැලි සංවර්ධන හා පාරිසරික අමාත්‍යාංශය විසින් පවත්වන්නට යෙදුන දත්ත පිළිබඳ ජාතික වැඩසටහන (National Data forum) සඳහා මෙම අමාත්‍යාංශය දායක වූ අතර පාරිසරික හා ආපදා දත්ත නිවැරදි තීරණ ගැනිමේ කාර්යයට සිදුකරනු ලබන දායකත්වය පිළිබඳව එක් සැසියක් පවත්වන ලදී.









පාසැල් ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනේ විශේෂ අවස්ථා.

## 03. ගිණුම් කටයුතු

### 3.1. මූල්‍ය ප්‍රගතිය

| ආයතනය | 2018 වර්ෂයසඳහා මූලධන වියදම් සඳහා වෙන් කළ ප්‍රතිපාදනය | 2018 දෙසැ 31 දක්වා මූලධන වියදම | මූලධන වියදම් වල කාර්ය සාධනය | 2018 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සඳහා වෙන් කළ ප්‍රතිපාදනය | 2018 දෙසැ 31 දක්වා පුනරාවර්තන වියදම | පුනරාවර්තන වියදම්වල කාර්යසාධනය |
|---|---|---|---|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | 8,400,000.00 | 6,357,687.94 | 75.69 | 51,950,000.00 | 39,166,907.08 | 75.39 |
| පරිපාලන හා ආයතනික සේවා | 547,400,000.00 | 508,209,194.54 | 92.84 | 89,000,000.00 | 78,268,340.04 | 87.94 |
| **එකතුව** | 555,800,000.00 | 514,566,882.48 | 92.58 | 140,950,000.00 | 117,435,247.12 | 83.32 |

### 3.2. වියදම් ඇස්තමේන්තුව - 2018

| | අමාත්‍ය කාර්යාලය 106-01-01 | | පරිපාලන හා ආයතනික සේවා 106-01-02 | |
|---|---|---|---|---|
| | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන |
| ඇස්තමේන්තු ප්‍රතිපාදන | 8,400,000.00 | 50,400,000.00 | 547,400,000.00 | 90,850,000.00 |
| මු.රෙ 66 යටතේ මාරු කිරීම් සහ පරිපූරක ප්‍රතිපාදන | 0.00 | 1,550,000.00 | 0.00 | -1,850,000.00 |
| ශුද්ධ ප්‍රතිපාදන | 8,400,000.00 | 51,950,000.00 | 547,400,000.00 | 89,000,000.00 |
| වියදම | 6,357,687.94 | 39,166,907.08 | 508,209,194.54 | 78,268,340.04 |
| වියදම් ප්‍රතිශතය | 75.69 | 75.39 | 92.84 | 87.94 |

### 3.3. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

| | වියදමෙහි උපරිම සීමාව | ලැබීමේ අවම සීමාව | උපරිම හර ශේෂ සීමාව |
|---|---|---|---|
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාව | 20,000,000.00 | 3,000,000.00 | 42,000,000.00 |
| 2018.12.31 දිනට සත්‍ය අගය | 14,236,662.00 | 10,063,969.37 | 31,391,627.84 |

### 3.4. 2018.12.31 දිනට ණය / අත්තිකාරම්

| ණය වර්ගය | ණය ප්‍රමාණය | ණය ලබාගත් සංඛ්‍යාව |
|---|---|---|
| උත්සව අත්තිකාරම් | 1,930,000.00 | 193 |
| ආපදා ණය | 12,228,662.00 | 87 |
| විශේෂ අත්තිකාරම් | 68,000.00 | 17 |
| **මුළු එකතුව** | **14,226,662.00** | **297** |

### 3.5. 2018 වසර තුළ අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන වියදම් පිළිබඳ විස්තර

| | අමාත්‍ය කාර්යාලය | | පරිපාලන හා ආයතනික සේවා | |
|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම |
| **මූලධන** | | | | |
| 2102 - ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ අත්පත් කර ගැනීම | 2,000,000.00 | 1,996,904.60 | 1,000,000.00 | 869,155.55 |
| 2103- යන්ත්‍ර සහ උපකරණ අත්පත් කර ගැනීම | 2,000,000.00 | 778,600.00 | 1,800,000.00 | 1,776,570.00 |
| මුළු එකතුව | 4,000,000.00 | 2,775,504.60 | 2,800,000.00 | 2,645,725.55 |
| මූල්‍යමය ප්‍රගතිය | | **69.39** | | **94.49** |
| **පුනරාවර්තන** | අමාත්‍ය කාර්යාලය | | පරිපාලන හා ආයතනික සේවා | |
| 1201- ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,600,000.00 | 1,145,696.50 | 1,400,000.00 | 1,375,793.25 |
| මුළු එකතුව | 1,600,000.00 | 1,145,696.50 | 1,400,000.00 | 1,375,793.25 |
| මූල්‍යමය ප්‍රගතිය | | **71.61** | | **98.27** |

## 04. අභ්‍යන්තර විගණන අංශය

4.1. අභ්‍යන්තර විගණන අංශයේ පරමාර්ථ සහ කාර්යය භාරය

පරමාර්ථ

- අමාත්‍යාංශය සහ අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයන් මගින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට ස්ථාපනය කර ඇති අභ්‍යන්තර පාලන ක්‍රමය තුළින් වැරදි වංචා වැළැක්වීම සහ අනාවරණය කර ගැනීමට ප්‍රත්‍යක්ෂ අභ්‍යන්තර සෝදිසි අඛණ්ඩව ඉටු කිරීම සහ ස්වාධින ඇගයීමක් පවත්වාගෙන යාම.

- අමාත්‍යාංශය සහ අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන්ට නියම කෙරුණු හෝ අමාත්‍යාංශය විසින් භාර ගන්නා ලද ව්‍යාපෘති සහ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ සැලසුම් හා වැඩ සටහන් සපුරාලීමෙහි ලබා ඇති ප්‍රගතිය නිශ්චය කිරීමට ප්‍රගති විමර්ශණ කටයුතු වලදී අමාත්‍යාංශයේ ලේකම්ට සහාය වීම.

- උචිත අවස්ථා වලදී මෙම කර්තව්‍යන් හි නිරත අයවලුන් හා අමාත්‍යාංශ ලේකම් අතර සම්බන්ධීකාරක වශයෙන් ක්‍රියා කිරීම.

කාර්යභාරය

- වැරදි හා වංචා වැලැක්වීම සඳහා ආයතන තුල ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමය සැලැස්ම අතින් මෙන්ම ක්‍රියාකාරීත්වය අතින්ද සාර්ථක දැයි සොයා බැලීම.

- ගිණුම් හා වෙනත් වාර්තා වල විශ්වාසනීයභාවය නිශ්චය කිරීම සඳහා යොදා ගෙන ඇති ගිණුම්කරණ පිළිවෙත් මගින් නිවැරදි මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේදැයි සොයා බැලීම.

- කාර්ය මණ්ඩලයට පවරා දී ඇති වගකීම් ඉටු කිරීමෙහි ලා ඔවුන්ගේ කාර්යය සාධණයෙහි ගුණාත්මක භාවය ඇගයීම

- ආයතනයේ වත්කම්, සියළු ආකාරයේ අලාභහානි වලින් කොතරම් දුරට ආරක්ෂා කර ඇත්දැයි සොයා බැලීම.

- ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ රජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ වල උපදෙස් පිළිපදිනු ලැබේදැයි පරීක්ෂා කිරීම.

- නාස්තිය, දූෂණය පමණ ඉක්මවා කරන වියදම් වැළැක්වීමට මෙන්ම අනාවරණය කර ගැනීමට තෝරා ගනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය සොයා බැලීම.

- ආයතනයේ ගිණුම් පටිපාටිය සහ දේපල හා වත්කම් ආරක්ෂාකාරී ලෙස අරපිරිමැස්මෙන් හා විධිමත් ලෙස පරිහරණය කරන්නේදැයි සොයා බැලීම

- අවශ්‍ය අවස්ථා වලදී විශේෂ විමර්ශණ පැවැත්වීම.

## 4.2. විගණන පරීක්ෂණ හා විශේෂ විමර්ශන කටයුතු පිළිබඳ ප්‍රගතිය - 2018

| අනු අංකය | විස්තරය | ඉදිරිපත් කල දිනය |
|---|---|---|
| 01 | වවුචර් පරීක්ෂාව - 2017 | 2018.01.11 |
| 02 | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා මෙහෙයුම් හා කල්බදු ක්‍රමය යටතේ මෝටර් රථ දෙකක් ලබා ගැනීම. | 2018.01.26 |
| 03 | මිනිස් පරිභෝජනයට නුසුදුසු සහල් ප්‍රසම්පාදන කමිටු තීරණ අනුව අලෙවි කිරීම සම්බන්ධ පරීක්ෂාව 2018.01.22 | 2018.01.26 |
| 04 | 2018 වර්ෂයේ මූලික වාර්තාව | 2018.01.29 |
| 05 | හදිසි සහනාධාර සහ භාණ්ඩ මිලදී ගැනීම -2017 | 2018.02.07 |
| 06 | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයට ජල ටැංකි මිලට ගැනීම. | 2018.03.05 |
| 07 | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයට ට්‍රැක්ටර් සහ ජල බවුසර් මිලට ගැනීම. | 2018.02.15 |
| 08 | වවුචර් පරීක්ෂාව 2018 (ජනවාරි මාසය) | 2018.04.24 |
| 09 | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ වාහන පරීක්ෂාව | 2018.05.03 |
| 10 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ වෙබ් අඩවිය විගණනය කිරීම. | 2018.05.09 |
| 11 | වාර්ෂික කාර්යසාධන වාර්තාව පරීක්ෂාව - 2017 | 2018.05.28 |
| 12 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව 2018 වර්ෂයේ පළමු කාර්තුවේ ප්‍රගතිය පරීක්ෂාව. | 2018.07.02 |
| 13 | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට ඔරු අඟුල් 100 ක් සැපයීම හා ගෙනවිත් බාර දීම. | 2018.07.04 |
| 14 | 2017 වර්ෂයට අදාළ භාණ්ඩ හා ගබඩා සමීක්ෂණ වාර්තා පරීක්ෂා කිරීම. | 2018.07.25 |
| 15 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2005 හි ඇමුණුම් 01 ට අනුව පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කර තිබේද යන්න පිළිබඳ පරීක්ෂාව | 2018.09.03 |
| 16 | අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි ප්‍රසම්පාදන කටයුතු විගණනය කිරීම | 2018.09.07 |
| 17 | 2018.09.12 දින අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරී රැස්වීමේදී ලේකම්තුමාගේ උපදෙස් පරිදි සිදු කරන ලද ප්‍රගතිය සම්බන්ධ වාර්තා කිරීම හා වගකිව යුත්තන් නිර්ණය කිරීම පිළිබඳ විශේෂ විගණන පරීක්ෂණය. | 2018.09.27 |

| | | |
|---|---|---|
| 18 | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අවම කිරීම් පර්යේෂණ හා සංවර්ධන අංශයේ 2018.08.31 දිනට ව්‍යාපෘති ප්‍රගතිය පරීක්ෂාව | 2018.09.27 |
| 19 | අමාත්‍යාංශයේ වාහන විගණනය කිරීම | 2018.11.07 |
| 20 | අමාත්‍යාංශ බිම් මහල, බිම් මහලේ වාහන රථ ගාල, හා ලේඛනාගාරය පරීක්ෂාව. | 2018.11.09 |
| 21 | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2017 වර්ෂයට අදාලව විදේශ පුහුණු වීම් සඳහා නිලධාරීන් යොමු කිරීමේ ලිපිගොනු පරීක්ෂාව | 2018.11.26 |
| 22 | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 117 හදිසි ඇමතුම් මැදිරිය සඳහා නව මෘදුකාංග ස්ථාපිත කිරීම පිළිබඳ විශේෂ පරීක්ෂාව | 2018.10.22 |

## 4.3. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම පිළිබඳ ප්‍රගතිය - 2018

| අනු අංකය | විස්තරය | ඉදිරිපත් කල දිනය |
|---|---|---|
| 01 | 2017 සිව්වන කාර්තුව | 2018.03.09 |
| 02 | 2018 පළමු කාර්තුව | 2018.06.21 |
| 03 | 2018 දෙවන කාර්තුව | 2018.10.11 |
| 04 | 2018 තෙවන කාර්තුව | 2018.12.20 |

## 4.4. රජයේ විගණන අංශයෙන් ලැබුණු විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීම - 2018

අමාත්‍යාංශයේ විගණන විමසුම් 20 ක් ද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් විගණන විමසුම් 05 ක් ද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අයත් විගණන විමසුම් 17ක් ද ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයට අයත් විගණන විමසුම් 11 ක් සඳහා පිළිතුරු සැපයීම සිදුකර ඇත.

# ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය

# 11 කොටස

# ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය

## හැඳින්වීම

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ලෙස 1996 වර්ෂයේදී සමාජ සේවා සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලදී. සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සැලසුම් කරනු පිණිස හා ක්‍රියාත්මක කරනු පිණිස එය 2005.12.08 දින අංක 1422/22 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආපදා සහන සේවා අමාත්‍යාංශය යටතට පත් විය. 2007.01.09 දින අංක 1482/9 දරණ ගැසට් නිවේදනය මගින් එය ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය යනුවෙන් නම් කොට නැවත පදිංචි කිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍යාංශය වෙත පවරන ලදි. අංක 1651/220 දරණ ගැසට් නිවේදනය ප්‍රකාරව 2010.04.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය කොළඹ 07, විද්‍යා මාවතේ පිහිටා ඇති අතර ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා සහ ලේකම් විසින් දෙනු ලබන උපදෙස් සහ මාර්ගෝපදේශකත්වය යටතේ ක්‍රියාත්මක වේ. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් දෙනු ලබන උපදෙස් අනුව අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා එහි ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. එමෙන්ම අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ සංවර්ධන සහකාර (ආපදා කළමනාකරණ), සංවර්ධන නිලධාරී (ආපදා සහනසේවා) යන නිළධාරීන් ආපදා සහන සම්බන්ධීකාරකවරු ලෙස ක්‍රියා කරති.

දැක්ම

ප්‍රශස්ථ පසු ආපදා සහන සේවාවන් තුළින් වඩාත් සුරක්ෂිත ශ්‍රී ලංකාවක් කරා යාම.

මෙහෙවර

ස්වභාවික හා මිනිසා විසින් ඇති කරනු ලබන ආපදාවන්ගෙන් සිදුවන අනර්ථකාරී බලපෑම්වල ප්‍රතිචාර දැක්වීම හා යථාවත් කිරීම මගින් මිනිස් ජීවිත, දේපළ හා ජන ජීවිතය සුරැකීම.

අරමුණ

සමාජයට පරිසරයට හා ආර්ථිකයට ආපදා වලින් ඇති කරන අහිතකර බලපෑම් අවම කිරීම සහ ආපදා සහන
සඳහා ජාතික ධාරිතාවන් ශක්තිමත් කිරීම තුළින් තිරසාර සංවර්ධනය කිරීමේ ජාතික අරමුණට දායක වීම.

ක්‍රියාකාරකම්

- ආපදා අවස්ථාවලදී පීඩාවට පත් පාර්ශවයන් සඳහා ක්ෂණික සහන සැපයීම පිළිබඳ වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- ආපදාවන්ගෙන් හානියට පත්වන නිවාස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සහන සැලසීම
- ආපදා අධි අවදානම් සහිත ප්‍රදේශවල සිටින ජනතාව නැවත පදිංචි කිරීම සඳහා ආපදා ප්‍රථ්‍යස්ථ නිවාස ඉදිකිරීමට මාර්ගෝපදේශ සැපයීම, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය
- ජාතික ස්වභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් ලැබෙන සහනාධාර කළමනාකරණය කිරීම
- පසු ආපදා තත්ත්වයන්වලට මුහුණ දීම සඳහා ප්‍රජාව හා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම
- පසු ආපදා කටයුතුවල නියලෙන නිලධාරීන් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ආපදා සහන සේවා පෙර සූදානම් සහ ප්‍රතිචාර දැක්වීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරී

### ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 වන දිනට කාර්යමණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවය | අනුමත කාර්යය මණ්ඩලය | තථ්‍ය කාර්යය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ | ශ්‍රී. ල. පරි. සේ | 01 | 01 | - |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී. ල. පරි. සේ | 01 | - | 01 |
| 03 | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී. ල. පරි. සේ | 06 | 04 | 02 |
| 04 | ගණකාධිකාරී | ශ්‍රී. ල. ගණ.සේ | 01 | - | 01 |
| 05 | පරිපාලන නිලධාරී | රා. ක. ස. සේ | 01 | - | 01 |
| 06 | සංවර්ධන සහකාර / සංවර්ධන නිලධාරී (ආපදා කළමනාකරණ/ ආපදා සහන සේවා) | සංවර්ධන නිලධාරි සේවය - | 368 | 349 | 19 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. ක. ස. සේ | 08 | 06 | 02 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිළධාරී ( II පංතිය) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 02 | - | 02 |
| | ව්‍යාපෘති නිලධාරි | - | 01 | - | 01 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර ( III පංතිය) (දත්ත සටහන් ක්‍රියාකරු) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 01 | - | 01 |
| | රියදුරු | රියදුරු සේවය | 07 | 06 | 01 |
| | කාර්යාල කාර්යය සහායක | කා. සේ. සේ | 04 | 03 | 01 |
| | ලොරි රියදුරු සහායක | - | 05 | 01 | 04 |
| එකතුව | | | **406** | **370** | **36** |

### ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

106 - ආපදා කළමනාකරණ අමාත්‍යවරයා 2 - සංවර්ධන වැඩසටහන 4 -ආපදා සහන මෙහෙයුම

| වැය විෂය | වැය විස්තර | මුළු ප්‍රතිපාදනය | වියදම (ජා.ආ.ස.සේ.ම ප්‍රධාන කාර්යාලය ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන් වෙත නිදහස් කරන ලද ප්‍රතිපාදන | 2018.12.31 දිනට වාර්තා වී ඇති වියදම | ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|
| | **පුනරාවර්තන වැය විෂයන්** | **5,755,690,000.00** | **61,612,971.17** | **5,674,682,223.98** | **5,647,578,238.00** | **98.12** |
| 106-2-4-1-1501 | සුභ සාධන වැඩසටහන්-ගංවතුර හා නියං සහනාධාර | 5,373,886,000.00 | 19,548,635.81 | 5,335,545,524.99 | 5,278,532,331.97 | 98.23 |
| 106-2-4-7-1508 | සාලාව වන්දි ගෙවීම | 3,600,000.00 | - | 3,600,000.00 | 3,587,100.00 | 99.64 |
| 106-2-4-9-1501 | මීතොටමුල්ල කුණු කන්ද නාය යාමෙන් හානි වූ නිවාස සඳහා වන්දි ගෙවීම | 33,304,000.00 | - | 33,304,000.00 | 29,253,500.00 | 87.84 |
| | වෙනත් පුනරුත්තාපන | 211,550,000.00 | 42,064,335.36 | 168,882,698.99 | 202,855,306.03 | 95.89 |
| | **මූලධන වැය විෂයන්** | **3,984,119,000.00** | **7,904,555.50** | **3,717,271,857.03** | **3,240,888,502.00** | **81.35** |
| 106-2-4-2001 | ගොඩනැගිලි-පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම (ඔරුගොඩවත්ත ගබඩාව) | 3,000,000.00 | - | 1,750,503.73 | 1,739,759.34 | 57.99 |
| 106-2-4-2101 | රථවාහන අත්පත් කර ගැනීම | 100,000,000.00 | 4,398,634.00 | 95,575,226.00 | 99,973,860.00 | 99.97 |
| 106-2-4-2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ-අත්පත් කරගැනී | 2,000,000.00 | 585,428.50 | 1,303,158.00 | 1,736,590.48 | 86.83 |
| 106-2-4-2103 | යන්ත්‍රෝපකරණ -අත්පත් කරගැනීම | 2,000,000.00 | 1,699,455.00 | 40,000.00 | 1,739,455.00 | 86.97 |
| 106-2-4-2401 | කාර්ය මණ්ඩල පුහුණු | 1,500,000.00 | 1,221,038.00 | 302,665.00 | 1,342,269.40 | 89.48 |
| 106-2-4-3-2104 | මීතොටමුල්ල කුණු කන්ද නාය යාමෙන් පීඩාවට පත් වූවන් සඳහා නිවාස වන්දි ගෙවීම. | 27,819,000.00 | - | 27,819,000.00 | 24,298,600.00 | 87.35 |
| 106-2-4-6-2202 | කෑගල්ල නායයෑමෙන් හානි වූ නිවාස ඉදිකිරීම | 800,000,000.00 | - | 643,240,238.88 | 385,883,013.81 | 48.24 |
| 106-2-4-2-2509 | වෙනත්-ගංවතුර හා නියං සහනාධාර (ජලටැංකි හා බවුසර් මිලදිගැනීම) | 100,000,000.00 | - | - | 54,399,346.75 | 54.40 |
| 106-2-4-12-2202 | නායයෑම් හා නායයෑම් හේතුවෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම | 1,845,800,000.00 | - | 1,845,241,065.69 | 1,578,837,848.68 | 85.54 |
| 106-2-4-13-2202 | සුරක්ෂිත මධ්‍යස්ථාන නවීකරණය කිරීම | 102,000,000.00 | - | 101,999,999.73 | 92,514,601.41 | 90.70 |
| 106-2-4-14-2506 | නායයෑම් හා ගංවතුර හේතුවෙන් ආපදාවට පත් මාර්ග පුනරුත්තාපන කිරීම | 1,000,000,000.00 | - | 1,000,000,000.00 | 998,423,157.13 | 99.84 |
| | මුළු එකතුව | **9,739,809,000.00** | **69,517,526.67** | **9,391,954,081.01** | **8,888,466,740.00** | **91.26** |

## 6. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් 2018 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්හි ප්‍රගතිය

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය ආපදා සහන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම සිදුකරයි. එම කටයුතු ජාතික අයවැය චක්‍ර ලේඛ 03/2016, ජාතික ස්වාභාවික ආපදා සඳහා වූ රක්ෂණාවරණ ප්‍රතිපත්තිය හා වරින් වර නිකුත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල අනුමැතීන්, චක්‍ර ලේඛ උපදෙස් අනුව ක්‍රියාත්මක කරනු ලැබේ. 2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ගංවතුර, නියඟය, නාය යෑම් හා අධික සුළඟින් දිවයිනේ බොහෝ ප්‍රදේශයන්හි ජනතාවගේ දෛනික ජන ජීවිතයට බලපෑම් ඇති විය. එමගින් මහ ජනතාව කෙරෙහි ඇතිවන්නා වූ අපහසුතාවයන්ට වඩාත් සාර්ථකව මුහුණ දීම සඳහා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය පසු ආපදා ප්‍රතිචාර දැක්වීමේ කටයුතුවලදී අති විශාල කාර්යයභාරයක් ඉටුකරන ලදී. එහි දී ක්‍රියාත්මක කරනු ලැබූ සුවිශේෂී ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

**6.1. කඩිනම් ආපදා සහන සැලසීම.**
**6.2. ස්වභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ රක්ෂණ වන්දි පිරිනැමීම.**
**6.3. විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**
**6.4. විදේශාධාර හා දේශීය ආධාර ලබා ගැනීම හා ආපදාවට පත්වූවනට බෙදාදීම**
**6.5. ආපදා සහන ද්‍රව්‍ය බෙදාදීම**







2018 වර්ෂයේ දෙසැම්බර් 31දිනට දිවයිනට බලපෑ ආපදාවන් හේතුවෙන් විපතට පත් වූවන්ගේ සංඛ්‍යාව ආපදාව අනුව පහත වගුවේ දක්වා ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | මුහුදු බාදනය | | | කණ්ඩි කඩාවැටීම | | | | | දියේ ගිලීම් | | | ගිනි ගැනීම් | | | | | නියඟය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | විපතට පත් පවුල් සංඛ්‍යාව | විපතට පත් පුද්ගල සංඛ්‍යාව | අර්ධ නිවාස හානි සංඛ්‍යාව | විපතට පත් පවුල් සංඛ්‍යාව | විපතට පත් පුද්ගල සංඛ්‍යාව | මරණ සංඛ්‍යාව | පූර්ණ නිවාස හානි සංඛ්‍යාව | අර්ධ නිවාස හානි සංඛ්‍යාව | විපතට පත් පවුල් සංඛ්‍යාව | විපතට පත් පුද්ගල සංඛ්‍යාව | මරණ සංඛ්‍යාව | විපතට පත් පවුල් සංඛ්‍යාව | විපතට පත් පුද්ගල සංඛ්‍යාව | මරණ සංඛ්‍යාව | පූර්ණ නිවාස හානි සංඛ්‍යාව | අර්ධ නිවාස හානි සංඛ්‍යාව | විපතට පත් පවුල් සංඛ්‍යාව | විපතට පත් පුද්ගල සංඛ්‍යාව |
| 1 | අම්පාර | | | | | | | | | | | | 4 | 20 | | 3 | 1 | 12020 | 39440 |
| 2 | අනුරාධපුර | | | | | | | | | | | | 1 | 4 | | | 1 | 244035 | 893003 |
| 3 | බදුල්ල | | | | 19 | 82 | | | 14 | | | | 17 | 78 | | 3 | 10 | 1294 | 4524 |
| 4 | මඩකලපුව | | | | | | | | | | | | 4 | 13 | | | 3 | 32409 | 105676 |
| 5 | කොළඹ | 22 | 87 | 5 | 5 | 19 | | | 5 | | | | 61 | 374 | 1 | 5 | 22 | | |
| 6 | ගාල්ල | | | | 17 | 67 | | | 2 | | | | | | | | | | |
| 7 | ගම්පහ | | | | | | | | | | | | 30 | 113 | | 17 | 13 | | |
| 8 | හම්බන්තොට | | | | 1 | 3 | | | 1 | | | | 1 | 5 | | 1 | | 4747 | 19722 |
| 9 | යාපනය | | | | | | | | | | | | 5 | 21 | | | 4 | 30421 | 110170 |
| 10 | කළුතර | | | | | | | | | | | | | | | | | 44374 | 215146 |
| 11 | මහනුවර | | | | 469 | 1968 | 1 | 7 | 209 | | | | 5 | 17 | | 2 | 3 | 140 | 620 |
| 12 | කෑගල්ල | | | | 100 | 385 | | 2 | 69 | 1 | 1 | 1 | 16 | 57 | | 3 | 11 | 164 | 847 |
| 13 | කිලිනොච්චි | | | | | | | | | 1 | 3 | 1 | | | | | | 34449 | 113899 |
| 14 | කුරුණෑගල | | | | | | | | | | | | 7 | 22 | | 3 | 3 | 32005 | 99050 |
| 15 | මන්නාරම | | | | | | | | | | | | 8 | 34 | | 2 | 2 | 29421 | 102163 |
| 16 | මාතලේ | | | | 5 | 20 | | 2 | 3 | 1 | 1 | 1 | 1 | 3 | | 1 | | 5908 | 20232 |
| 17 | මාතර | | | | | | | | | | | | 1 | 6 | | 1 | | | |
| 18 | මොණරාගල | | | | | | | | | | | | 1 | 5 | | | 1 | 6163 | 22374 |
| 19 | මුලතිව් | | | | | | | | | | | | 6 | 25 | | 1 | | 8103 | 27347 |
| 20 | නුවරඑළිය | | | | 59 | 248 | | | 57 | | | | 15 | 62 | | 3 | 10 | | |
| 21 | පොළොන්නරුව | | | | | | | | | | | | 2 | 10 | | | 2 | 6824 | 25339 |
| 22 | පුත්තලම | 281 | 1134 | | | | | | | | | | 16 | 55 | | 2 | 5 | 66648 | 216670 |
| 23 | රත්නපුර | | | | 61 | 219 | | | 6 | | | | | | | | | 240 | 1000 |
| 24 | ත්‍රිකුණාමලය | | | | | | | | | 3 | 11 | 5 | 1 | 3 | | | 1 | 6310 | 19123 |
| 25 | වව්නියාව | | | | | | | | | | | | | | | | | 2312 | 8435 |
| | **මුළු එකතුව** | **303** | **1221** | **5** | **736** | **3011** | **1** | **11** | **366** | **6** | **16** | **8** | **202** | **927** | **1** | **47** | **92** | **567987** | **2044780** |

| අනු අංකය | දිස්ත්‍රික්කය | ගංවතුර | | | | | අධික වර්ෂාව | | | | | අධික සුළං | | | | | නාය යෑම් | | | | නාය යෑම් අවධාම් | | | | අකුණු | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | විපතට පත් පවුල් සංඛ්‍යාව | විපතට පත් පුද්ගල සංඛ්‍යාව | මරණ සංඛ්‍යාව | පූර්ණ නිවාස හානි සංඛ්‍යාව | අර්ධ නිවාස හානි සංඛ්‍යාව | විපතට පත් පවුල් සංඛ්‍යාව | විපතට පත් පුද්ගල සංඛ්‍යාව | මරණ සංඛ්‍යාව | පූර්ණ නිවාස හානි සංඛ්‍යාව | අර්ධ නිවාස හානි සංඛ්‍යාව | විපතට පත් පවුල් සංඛ්‍යාව | විපතට පත් පුද්ගල සංඛ්‍යාව | මරණ සංඛ්‍යාව | පූර්ණ නිවාස හානි සංඛ්‍යාව | අර්ධ නිවාස හානි සංඛ්‍යාව | විපතට පත් පවුල් සංඛ්‍යාව | විපතට පත් පුද්ගල සංඛ්‍යාව | පූර්ණ නිවාස හානි සංඛ්‍යාව | අර්ධ නිවාස හානි සංඛ්‍යාව | විපතට පත් පවුල් සංඛ්‍යාව | විපතට පත් පුද්ගල සංඛ්‍යාව | පූර්ණ නිවාස හානි සංඛ්‍යාව | අර්ධ නිවාස හානි සංඛ්‍යාව | විපතට පත් පවුල් සංඛ්‍යාව | විපතට පත් පුද්ගල සංඛ්‍යාව | මරණ සංඛ්‍යාව | පූර්ණ නිවාස හානි සංඛ්‍යාව | අර්ධ නිවාස හානි සංඛ්‍යාව |
| 1 | අම්පාර | 10335 | 34708 | | 1 | 30 | 18 | 74 | | 1 | 8 | 1487 | 5807 | | 30 | 1226 | | | | | | | | | 8 | 23 | 4 | | 4 |
| 2 | අනුරාධපුර | 35 | 133 | | 2 | 33 | 404 | 1522 | 1 | 50 | 145 | 270 | 1216 | 1 | 15 | 287 | | | | | | | | | | | | | |
| 3 | බදුල්ල | | | | | | 279 | 1088 | 4 | | 173 | 523 | 2136 | 2 | | 523 | 27 | 99 | | 9 | 162 | 678 | | 62 | 7 | 26 | 1 | | 5 |
| 4 | මඩකලපුව | 33612 | 115334 | 1 | 55 | 116 | | | | | | 210 | 779 | | 27 | 151 | | | | | | | | | 7 | 26 | 2 | | 2 |
| 5 | කොළඹ | 8705 | 34759 | 2 | 1 | 2994 | 1740 | 6697 | | 1 | 48 | 638 | 2083 | 1 | 1 | 614 | | | | | | | | | 28 | 123 | | | 18 |
| 6 | ගාල්ල | 4266 | 16272 | 2 | 26 | 951 | 2485 | 9975 | 1 | 5 | 339 | 353 | 1128 | | 3 | 336 | 23 | 96 | 1 | 17 | | | | | 54 | 217 | 2 | | 41 |
| 7 | ගම්පහ | 8483 | 33550 | 2 | 3 | 1341 | 6349 | 25576 | 2 | 221 | 2591 | 494 | 2057 | 1 | 11 | 475 | 11 | 53 | | 11 | | | | | 23 | 92 | | | 21 |
| 8 | හම්බන්තොට | | | | | | 137 | 526 | | 2 | 17 | 256 | 889 | | 7 | 219 | 1 | 5 | | 1 | | | | | 27 | 110 | | | 19 |
| 9 | යාපනය | 5996 | 18956 | 6 | 3 | 310 | 8 | 30 | | | 8 | 1137 | 4196 | 1 | 85 | 646 | | | | | | | | | 17 | 66 | 1 | | 2 |
| 10 | කළුතර | 7438 | 28876 | 8 | 37 | 1392 | 342 | 1303 | | 6 | 334 | 413 | 1453 | 1 | 2 | 401 | | | | | 2 | 12 | | | | | | | |
| 11 | මහනුවර | 246 | 1072 | | | 19 | 181 | 704 | | 4 | 161 | 578 | 2177 | | 6 | 564 | 12 | 45 | 1 | | 423 | 1769 | 2 | 103 | 25 | 101 | 1 | | 21 |
| 12 | කෑගල්ල | 1582 | 5990 | 3 | 6 | 905 | 71 | 273 | | | 73 | 974 | 3819 | 3 | 6 | 877 | | | | | 5 | 16 | | | 119 | 478 | | | 96 |
| 13 | කිලිනොච්චි | 26575 | 83174 | 1 | 388 | 2231 | | | | | | 92 | 329 | | 32 | 57 | | | | | | | | | 1 | 2 | | | 1 |
| 14 | කුරුණෑගල | 141 | 552 | | | 1 | 3799 | 13056 | 3 | 46 | 358 | 1397 | 5158 | 1 | 50 | 1337 | 5 | 17 | 2 | 2 | | | | | 15 | 57 | | | 11 |
| 15 | මන්නාරම | 88 | 295 | 4 | | | 1533 | 4597 | | | | 22 | 87 | 3 | | 7 | | | | | | | | | 1 | 4 | | | 1 |
| 16 | මාතලේ | 97 | 340 | | 4 | 83 | 130 | 507 | | 2 | 96 | 164 | 564 | | 1 | 155 | | | | | | | | | 1 | 7 | | | 1 |
| 17 | මාතර | 139 | 571 | | 7 | 132 | 29 | 117 | | | 29 | 220 | 874 | 1 | 5 | 185 | | | | | | | | | | | | | |
| 18 | මොණරාගල | 15 | 54 | | | 15 | 2 | 8 | | | 1 | 409 | 1698 | 2 | 5 | 390 | 8 | 24 | | | 113 | 389 | | | 20 | 83 | | 1 | 19 |
| 19 | මුලතිව් | 11029 | 34697 | | 177 | 2319 | | | | | | 206 | 790 | | 6 | 200 | | | | | | | | | 3 | 10 | 1 | | 2 |
| 20 | නුවරඑළිය | 197 | 795 | | 2 | 71 | 393 | 1494 | 1 | 3 | 206 | 476 | 1979 | | | 437 | 411 | 1832 | 8 | 181 | 383 | 1626 | 7 | 51 | 20 | 67 | | | 19 |
| 21 | පොළොන්නරුව | 42 | 146 | | | | 17 | 60 | | | 17 | 175 | 659 | | 3 | 165 | | | | | | | | | 37 | 134 | 5 | 2 | 22 |
| 22 | පුත්තලම | 12275 | 44484 | 2 | 59 | 990 | 989 | 3576 | | | 22 | 927 | 3382 | 1 | 1 | 879 | | | | | | | | | 668 | 2857 | 3 | | 106 |
| 23 | රත්නපුර | 8959 | 34892 | 2 | 18 | 563 | 105 | 392 | 2 | | 91 | 596 | 2120 | 4 | 5 | 448 | | | | | 136 | 544 | 1 | 18 | 15 | 58 | 2 | | 13 |
| 24 | ත්‍රිකුණාමලය | 33 | 119 | | | | 1083 | 3984 | 1 | 2 | 47 | 26 | 92 | | | 26 | | | | | | | | | 3 | 15 | 3 | | |
| 25 | වව්නියාව | 155 | 526 | | | 2 | 4 | 18 | | | 4 | 51 | 168 | | 4 | 41 | | | | | | | | | 3 | 15 | | | 3 |
| | **මුළු එකතුව** | **140443** | **490295** | **33** | **789** | **14498** | **20098** | **75577** | **15** | **343** | **4768** | **12094** | **45640** | **22** | **305** | **10646** | **498** | **2171** | **12** | **221** | **1224** | **5034** | **10** | **234** | **1102** | **4571** | **25** | **3** | **427** |

## 6.1. කඩිනම් ආපදා සහන සැලසීම.

### 6.1.1. වැය ශීර්ෂ අංක 2-4-6-1-1501 යටතේ ස්වභාවික ආපදා හේතුවෙන් විපතට පත් ජනතාව වෙත පිසූ ආහාර, වියළි සලාක, පානීය ජලය ලබා දීම

ඒ අනුව 2018.12.31 දින වන විට වැය ශීර්ෂ අංක 2-4-6-1-1501 යටතේ රජය මගින් නියඟය, ගංවතුර, නායයෑම් හා අනෙකුත් ආපදාවන් සඳහා - රු.මිලියන 5,373.88 ප්‍රතිපාදන වෙන් කොට ඇති අතර එම ප්‍රතිපාදන වලින් රු.මිලියන 5,355.26 ප්‍රතිපාදන ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථාන මගින් සහන සේවා කටයුතු සහඳහා යොදවා ඇත.

**ස්වභාවික ආපදා හේතුවෙන් විපතට පත් ජනතාවට සහන සැලසීමේ ප්‍රගතිය**

ගං වතුර, නාය යෑම්,නියඟය හා අනෙකුත් ආපදා අවස්ථාවන්හි පීඩාවට පත් ජනතාවට පිසූ ආහාර,වියළි සලාක, පානීය ජලය ලබා දීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත 2018.12.31 දින වන විට ලබා දුන් ප්‍රතිපාදන හා එහි වියදම් දිස්ත්‍රික් මට්ටමින් පහත වගුවවේ දක්වා ඇත.

| දිස්ත්‍රික්කය | 2018.12.31 දින දක්වා ලබා දී ඇති ප්‍රතිපාදන | 2018.12.31 දිනට වියදම් | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| කොළඹ | 625,489,517.16 | 622,138,638.75 | 99% |
| ගම්පහ | 10,988,631.15 | 9,800,186.18 | 89% |
| කලුතර | 17,109,448.37 | 14,932,845.32 | 87% |
| මහනුවර | 3,069,538.19 | 2,859,600.04 | 93% |
| මාතලේ | 7,873,050.00 | 7,441,950.39 | 95% |
| නුවර එළිය | 3,434,245.00 | 2,700,064.06 | 79% |
| ගාල්ල | 8,902,357.02 | 8,524,464.98 | 96% |
| මාතර | 5,280,516.45 | 2,571,860.31 | 49% |
| හම්බන්තොට | 2,438,450.00 | 2,049,569.84 | 84% |
| යාපනය | 150,832,076.73 | 150,830,542.45 | 100% |
| මන්නාරම | 6,833,064.00 | 4,396,985.44 | 64% |
| වවුනියා | 15,440,112.50 | 12,664,931.38 | 82% |
| මුලතිවු | 133,865,750.00 | 131,107,265.61 | 98% |
| කිලිනොච්චි | 61,598,707.65 | 59,635,423.18 | 97% |
| මඩකලපුව | 17,772,612.18 | 17,509,182.02 | 99% |
| අම්පාර | 16,776,080.70 | 14,899,523.28 | 89% |
| ත්‍රිකුණාමලය | 108,117,801.06 | 107,467,369.41 | 99% |
| කුරුණෑගල | 1,200,797,967.43 | 1,197,695,594.16 | 100% |
| පුත්තලම | 128,215,703.33 | 127,153,096.04 | 99% |
| අනුරාධපුරය | 961,117,671.00 | 932,917,376.58 | 97% |
| පොලොන්නරුව | 64,319,458.60 | 59,108,891.62 | 92% |
| බදුල්ල | 3,963,741.88 | 2,786,103.29 | 70% |
| මොණරාගල | 7,532,543.12 | 6,484,886.26 | 86% |
| රත්නපුර | 89,845,978.31 | 77,793,355.73 | 87% |
| කෑගල්ල | 13,930,503.16 | 13,342,103.84 | 96% |
| ප්‍රධාන කාර්යාලය | 19,720,521.81 | 19,720,521.81 | 100% |
| සමූපකාරය | 1,670,000,000.00 | 1,670,000,000.00 | 100% |
| **එකතුව** | **5,355,266,046.80** | **5,278,532,331.97** | 99% |

## 6.1.2. වැය ශීර්ෂ අංක 2-4-6-1-1501 යටතේ නියඟයෙන් පීඩාවට පත් ජනතාව වෙත සහන සැලසීම

2018-12-31 දිනට දිවයිනේ දිස්ත්‍රික් 20 වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් පවුල් 567987 ක පුද්ගලයන් 2044780 ක් පීඩාවට පත්ව ඇත. එම ජනතාව සඳහා පානීය ජලය ලබා දීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන ලබා දීම,පානීය ජලය ප්‍රවාහනය කිරීමට හා ගබඩා කිරීමට ට්‍රැක්ටර් බවුසර්,ලොරි බවුසර් හා ජල ටැංකි ලබාදීම, දැඩි වියළි කාලගුණය හේතුවෙන් කෘෂිකර්මාන්තයට ඇතිවූ බලපෑමෙන් පීඩාවට පත් ජනතාව සඳහා වියළි සළාක ලබාදීම ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් සිදු කරන ලදී.

**නියඟයෙන් විපතට පත් ජනතාවට සහන සැලසීමේ ප්‍රගතිය**

2018-12-31 දිනට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නියඟයෙන් පීඩාවට පත් ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීමට රු.මි 92.12 ප්‍රතිපාදන ලබා දී ඇත.

වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් ජනතාව වෙත පානිය ජලය සැපයීම සඳහා ප්‍රතිපාදන ලබා දීම 2018

| අනු අංකය | දිස්ත්‍රික්කය | ලබා දුන් ප්‍රතිපාදන රු. |
|---|---|---|
| 1 | කුරුණෑගල | 15,098,470.55 |
| 2 | පුත්තලම | 4,639,228.09 |
| 3 | කෑගල්ල | 331,147.33 |
| 4 | අනුරාධපුරය | 6,561,295.00 |
| 5 | අම්පාර | 7,170,902.70 |
| 6 | මුලතිව් | 5,631,050.00 |
| 7 | යාපනය | 19,327,551.73 |
| 8 | වව්නියාව | 4,446,587.50 |
| 9 | පොළොන්නරුව | 5,856,433.60 |
| 10 | කිලිනොච්චිය | 8,870,907.65 |
| 11 | මන්නාරම | 3,434,911.00 |
| 12 | මොණරාගල | 1,329,000.00 |
| 13 | කළුතර | 1,000,000.00 |
| 14 | ත්‍රිකුණාමලය | 1,222,625.49 |
| 15 | මහනුවර | 50,000.00 |
| 16 | මඩකළපුව | 4,515,672.09 |
| 17 | මාතලේ | 1,100,000.00 |
| 18 | හම්බන්තොට | 1,430,000.00 |
| 19 | රත්නපුරය | 110,000.00 |
| එකතුව | | 92,125,782.73 |

**නියඟය හේතුවෙන් කෘෂිකාර්මික කටයුතුවලට බලපෑම් එල්ලවූ පවුල් වෙත වියළි සලාක ලබා දීම**

වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් කෘෂි කාර්මික හා කෘෂි කාර්මික කම්කරු පවුල් වල ජනතාවගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමන් විසින්ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුවනිකුත් කරන ලද චක්‍රලේඛ අංක **NDRSC/2017/01** හා **2017.08.02** ට අනුව සාමාජිකයින් තිදෙනෙකුට අඩු පවුලක් සඳහා සති දෙකකට රු. **2,000/=** ක් බැගින් මසකට රු. **4,000/=** ක වියළි සළාකයක් හා සාමාජිකයින් තිදෙනෙකු හෝ ඊට වැඩි පවුලක් සඳහා සතිදෙකකට වරක් රු. **2,500/=** ක් බැගින් මසකට රු. **5,000/=** ක් දීමනාවක් ලබා දීම සිදු කරන ලදී.

2018 වර්ෂයේ නියඟයෙන් පීඩාවට පත් ගොවී ජනතාව වෙත නියං සහනාධාර ලබා දීම හා එහි වියදම පහත වගුවේ දක්වා ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ලබා දී ඇති මුළු මුදල රු. | පළමු වාරිකයෙහි ප්‍රගතිය | | දෙවන වාරිකයෙහි ප්‍රගතිය | | මුළු වියදම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | පවුල් සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය රු. | පවුල් සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය රු. | |
| 1 | අනුරාධපුරය | 818,113,644.00 | 137,881 | 631,441,000.00 | 48,262 | | 631,441,000.00 |
| 2 | අම්පාර | 8,138,500.00 | 3,450 | 8,138,500.00 | | | 8,138,500.00 |
| 3 | කිලිනොච්චිය | 47,253,000.00 | 4,747 | 20,506,758.00 | | | 20,506,758.00 |
| 4 | කුරුණෑගල | 890,028,000.00 | 102,862 | 463,684,833.15 | 85,830 | 393,316,000.00 | 857,000,833.15 |
| 5 | පුත්තලම | 117,904,881.00 | 12,201 | 56,450,472.00 | 13,275 | 61,454,409.00 | 117,904,881.00 |
| 6 | පොළොන්නරුව | 12,550,000.00 | 1,450 | 6,964,000.00 | 1,335 | 6,413,000.00 | 13,377,000.00 |
| 7 | මාතලේ | - | | | | | - |
| 7 | මුලතිව් | 63,656,093.63 | 6,824 | 30,037,093.00 | 7,296 | 33,619,000.63 | 63,656,093.63 |
| 8 | යාපනය | 130,000,000.00 | 14,465 | 65,000,000.00 | 14,465 | 65,000,000.00 | 130,000,000.00 |
| 9 | වවුනියාව | 9,457,000.00 | 991 | 4,728,000.00 | 992 | 4,729,000.00 | 9,457,000.00 |
| එකතුව | | **2,097,101,118.63** | **284,871** | **1,286,950,656.15** | **171,455** | **564,531,409.63** | **1,851,482,065.78** |

2017 වර්ෂයේ වියළි සළාක ලබාදී වියදම් පියවීමට නොහැකි වූ බිල්පත් සඳහා 2018 වර්ෂයේදී දිස්ත්‍රික් 09 සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලදි. එම ප්‍රතිපාදන පහත වගුවේ දක්වා ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | මුදල් ලබා දීම 2018 වර්ෂය (අතැති බිල්පත් සඳහා) |
|---|---|---|
| 1 | අනුරාධපුරය | 110,559,500.00 |
| 2 | මොණරාගල | 4,551,879.12 |
| 3 | පොළොන්නරුව | 18,109,217.50 |
| 4 | කුරුණෑගල | 316,654,701.86 |
| 5 | මුලතිව් | 61,881,906.37 |
| 6 | ත්‍රිකුණාමලය | 105,895,175.57 |
| 7 | මාතලේ | 5,192,500.00 |
| 8 | මඩකලපුව | 10,829,990.09 |
| 9 | රත්නපුර | 65,678,368.78 |
| එකතුව | | 699,353,239.29 |

## 6.2. ස්වභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ රක්ෂණ වන්දි පිරිනැමීම.

### 6.2.1. ස්වභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ ස්වභාවික ආපදා හේතුවෙන් විපතට පත්වූ ජනතාව වෙත කඩිනම් සහන සැලසීම

2016 අය වැය යෝජනාවක් ලෙස ඉදිරිපත්කරන ලද ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන ජාතික රක්ෂණ භාර අරමුදල සමග ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් 2016 අප්‍රේල් 01 වෙනි දින සිට දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. මෙම රක්ෂණාවරණ ප්‍රතිපත්ති මාලාව යටතේ විශේෂයෙන්ම සුනාමි සහ භූමි කම්පා, ගංවතුර, නාය යෑම්, සුළි සුළං සහ කුණාටු ( නියඟය, ගිණි හානි ආවරණය නොවේ) වැනි ස්වාභාවික ආපදාවලින් විපතට පත්වූවන් සඳහා පිසූ ආහාර, වියළි සළාක, මරණ වන්දි සඳහා රක්ෂණාවරණය සැළසීමත් හානියට පත් නිවාස, ගෘහ උපකරණ, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට සහ එම කර්මාන්තවල උපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ තොගවල තක්සේරු වටිනාකම්වලට අදාළව රක්ෂණ වන්දි පිරිනැමීමත් සිදුවේ. 2018 වර්ෂයේ වාර්ෂික රක්ෂණ වාරික මුදල සඳහා රාජ්‍ය දායකත්වය රුපියල් මිලියන 500 කි.ජාතික ස්වභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ ස්වභාවික ආපදා සඳහා බිලියන 15 ක රක්ෂණාවරණයක් හිමිවන අතර එයින් රුපියල් බිලියන 2.5 ක කඩිනම් ආපදා සහනාධාර සඳහා වාර්ෂිකව වෙන්වේ.ස්වාභාවික ආපදාවන්ගෙන් සිදුවන දේපළ හානි යටතේ නිවාස සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට සිදුවන ගොඩනැගිලි හානි සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 12.5 ක රක්ෂණාවරණයක් හිමිවේ.

ඒ අනුව ජාතික ස්වභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ ආවරණයවන ස්වභාවික ආපදාවන්ගෙන් විපතට පත්වූවන් සඳහා කඩිනම් සහන සැලසීම සඳහා 2018.12.31 දින වන විට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් රු.මි. 191.23 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිදහස් කර ඇත.

| දිස්ත්‍රික්කය | 2018.12.31 දින දක්වා ලබා දී ඇති ප්‍රතිපාදන |
|---|---|
| අම්පාර | 5,592,384.00 |
| අනුරාධපුර | 493,550.00 |
| බදුල්ල | 1,777,384.00 |
| මඩකලපුව | 12,803,093.00 |
| කොළඹ | 18,139,540.00 |
| ගාල්ල | 4,100,000.00 |
| ගම්පහ | 33,662,914.29 |
| හම්බන්තොට | 300,000.00 |
| යාපනය | 869,200.00 |
| කළුතර | 8,216,759.21 |
| මහනුවර | 2,050,420.00 |
| කෑගල්ල | 3,700,300.00 |

| දිස්ත්‍රික්කය | 2018.12.31 දින දක්වා ලබා දී ඇති ප්‍රතිපාදන |
|---|---|
| කිලිනොච්චි | 22,823,100.00 |
| කුරුණෑගල | 9,341,959.50 |
| මන්නාරම | 368,700.00 |
| මාතර | 1,000,000.00 |
| මාතලේ | 67,900.00 |
| රත්නපුර | 14,306,426.00 |
| මොණරාගල | 815,000.00 |
| මුලතිවු | 24,441,100.00 |
| නුවර එළිය | 7,676,461.00 |
| පොළොන්නරුව | 346,100.00 |
| පුත්තලම | 18,246,479.00 |
| එකතුව | **191,238,770.00** |

## 6.2.2. ස්වභාවික ආපදාවන්ගෙන් හානියට පත් නිවාස, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරික ස්ථාන හා ඒවායේ ගෘහ උපකරණ සඳහා වන්දි මුදල් ලබා දීම

මෙම රක්ෂණාවරණ ප්‍රතිපත්තිය යටතේ ස්වාභාවික ආපදාවලින් හානි සිදුවන නිවාස සඳහා හානි ඇස්තමේන්තුව පදනම් කරගනිමින් රුපියල් මිලියන 2.5 ක උපරිමය දක්වා රක්ෂණාවරණයක් හිමිවේ. වෙනත් රක්ෂණාවරණයකින් ප්‍රතිලාභ නොලබන වාර්ෂික ආදායම රු.මි. 10 නොඉක්මවන සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා රු.මි. 2.5 ක උපරිමයකට යටත්ව වන්දි මුදලකට හිමිකම් ලබයි.

2018 ජනවාරි සිට අගෝස්තු 31 දක්වා කාලය තුළ ඇතිවූ ගංවතුර, නායයෑම් හේතුවෙන් හානියට පත් නිවාස සඳහා වන්දි මුදල් ලබාදීම සඳහා හානි තක්සේරු කටයුතු සිදු කර අයදුම්පත් ඉදිරිපත් කරන තෙක් එම නිවාස කඩිනමින් පිළිසකර කරගැනීම සඳහා නිවාස හානියට පත්වූවන් වෙත රුපියල් 10,000/- ක අත්තිකාරම් මුදලක් ලබා දීම සිදු කරන ලදී. ප්‍රතිලාභීන් වෙත එම මුදල් ලබාදීමේ ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

**2018-12-31 දිනට නිවාස හානි සඳහා රුපියල් 10,000/- ක අත්තිකාරම් මුදලක් ලබා දීම**

| අනු අංකය | දිස්ත්‍රික්කය | නිවාස හානි සංඛ්‍යාව | දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදී ඇති මුදල (රු.) |
|---|---|---|---|
| 1 | ගාල්ල | 2,807 | 20,956,100.00 |
| 2 | රත්නපුර | 863 | 10,956,000.00 |
| 3 | බදුල්ල | 341 | 7,098,460.50 |
| 4 | නුවරඑළිය | 117 | 5,140,000.00 |
| 5 | කෑගල්ල | 911 | 9,251,500.00 |
| 6 | කළුතර | 649 | 22,451,500.00 |
| 7 | ගම්පහ | 1,791 | 36,321,799.10 |
| 8 | කුරුණෑගල | 1,543 | 9,295,245.40 |
| 9 | පුත්තලම | 2,545 | 17,940,000.00 |
| 10 | කොළඹ | 2,447 | 34,929,607.07 |
| 11 | මාතර | 139 | 980,000.00 |
| 12 | මොණරාගල | 306 | 3,670,000.00 |
| 13 | පොළොන්නරුව | 70 | 1,580,700.00 |

| අනු අංකය | දිස්ත්‍රික්කය | නිවාස හානි සංඛ්‍යාව | දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදී ඇති මුදල (රු.) |
|---|---|---|---|
| 14 | මුලතිව් | 2,583 | 25,950,000.00 |
| 15 | හම්බන්තොට | 238 | 2,336,380.00 |
| 16 | වව්නියාව | 13 | 40,000.00 |
| 17 | අම්පාර | 1,116 | 8,530,000.00 |
| 18 | ත්‍රිකුණාමලය | 50 | 500,000.00 |
| 19 | අනුරාධපුරය | 294 | 2,510,000.00 |
| 20 | යාපනය | 1,421 | 14,210,000.00 |
| 21 | මාතලේ | 137 | 1,370,000.00 |
| 22 | මඩකලපුව | 177 | 2,680,000.00 |
| 23 | මහනුවර | 52 | 520,000 |
| 24 | කිලිනොච්චි | 2,613 | 26,130,000 |
| එකතුව | | **23,223** | **265,347,292** |

2018 මැයි මස සිට සිදුවූ ආපදාවන්ගෙන් හානියට පත් දේපළ සඳහා ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ රු.10,000/- හෝ රු.25,000/- ක් දක්වා වූ වන්දි ලබාදීම පහත වගුවේ දක්වා ඇත

**2018-12-31 දිනට නිවාස හානි සඳහා රු.10,000/- හෝ රු.25,000/- ක් දක්වා වූ වන්දි ලබාදීම**

| අනු අංකය | දිස්ත්‍රික්කය | නිවාස හානි සංඛ්‍යාව | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හානි | දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබා දී ඇති මුදල (රු.) |
|---|---|---|---|---|
| 1 | කොළඹ | 63 | - | 920,065.00 |
| 2 | ගම්පහ | 61 | - | 3,416,977.10 |
| 3 | කලුතර | 56 | - | 582,760.00 |
| 4 | බදුල්ල | 94 | - | 1,778,473.50 |
| 5 | කුරුණෑගල | 194 | - | 1,465,292.40 |
| 6 | පුත්තලම | 22 | - | 183,759.35 |
| 7 | කෑගල්ල | 23 | - | 217,000.00 |
| 8 | රත්නපුර | 21 | - | 243,575.00 |
| 9 | පොලොන්නරුව | 16 | - | 617,019.00 |
| 10 | ගාල්ල | - | 2,600 | 7,571,256.00 |
| 11 | මාතලේ | 139 | - | 1,885,494.31 |
| **එකතුව** | | **689** | **2,600** | **18,881,671.66** |

2018 මැයි ජුනි, ජූලි, අගොස්තු,දෙසැම්බර් මස සිදුවූ ආපදාවන්ගෙන් හානියට පත් දේපළ අතුරින් රුපියල් 25000/- ට වැඩි හානි තක්සේරු සඳහා වන්දි ලබා දීම වෙනුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත අයදුම්පත් යොමු කිරීම පහත වගුවේ දක්වා ඇත.

**රුපියල් 25000/- ට වැඩි හානි සඳහා වන්දි ලබා දීම වෙනුවෙන් අයදුම්පත් යොමු කිරීම**

| දිස්ත්‍රික්කය | අයදුම්පත් සංඛ්‍යාව | වන්දි මුදල් ලබා දී ඇති අයදුම්පත් සංඛ්‍යාව | ලබා දුන් මුදල රු. |
|---|---|---|---|
| කොළඹ | 1291 | 193 | 4,879,416.00 |
| ගම්පහ | 930 | 533 | 11,988,370.00 |
| කලුතර | 499 | 378 | 4,598,565.00 |
| මහනුවර | 589 | 137 | 4,851,650.00 |
| මාතලේ | 241 | 9 | 272,420.00 |
| නුවර එළිය | 77 | 76 | 946,500.00 |
| ගාල්ල | 371 | 110 | 3,430,508.00 |
| මාතර | 68 | 24 | 586,640.00 |
| හම්බන්තොට | 145 | 0 | 73,000.00 |
| යාපනය | 46 | 8 | 202,400.00 |
| වවුනියා | 1 | 1 | 100,000.00 |
| මඩකලපුව | 127 | 8 | 260,150.00 |
| අම්පාර | 365 | 194 | 5,607,197.00 |
| ත්‍රිකුණාමලය | 5 | 4 | 262,500.00 |
| කුරුණෑගල | 1581 | 322 | 17,302,242.00 |
| පුත්තලම | 600 | 74 | 2,864,210.00 |
| අනුරාධපුරය | 348 | 166 | 3,054,290.00 |
| පොලොන්නරුව | 91 | 34 | 1,064,425.00 |
| බදුල්ල | 152 | 68 | 2,470,900.00 |
| මොණරාගල | 276 | 145 | 2,534,190.00 |
| රත්නපුර | 590 | 120 | 4,213,623.00 |
| කෑගල්ල | 1616 | 497 | 11,980,232.00 |
| මුලතිව් | 77 | 24 | 256,000.00 |
| **එකතුව** | **10086** | **3125** | 83,799,428.00 |

## 6.3. විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### ශ්‍රී ලංකා - චීන මිත්‍රත්ව ගම්මානය ඉදිකිරීම

2016 මැයි මස දිවයිනේ දිස්ත්‍රික්ක ගණනාවක ඇතිවූ ආපදා තත්ත්වය හේතුවෙන් ආපදාවන්ට පත්වූවන්ට සහන සැලසීම සඳහා ශ්‍රී ලංකා රජය වෙත මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබාදෙන ලද අතර, චීන සමූහාණ්ඩුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 1.5 ක් ලැබුණු අතර එම මුදල යොදාගනිමින් කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රුවන්දෙනිය වත්ත නිවාස 60 ක් ඉදිකිරීම් අවසන් කර 2018 ජුනි මස 04 දින ප්‍රතිලාභී පවුල් වෙත බෙදා දීම සිදුරකන ලදී.




ඉදිකරන ලද නිවාස

## 7. 106-2-4-12-2202 වැය විෂය යටතේ ආපදා අධි අවදානම් සහිත ප්‍රදේශවල සිටින ජනතාව නැවත පදිංචි කිරීම සඳහා ආපදා ප්‍රත්‍යස්ථ නිවාස ඉදිකිරීම

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් 2017.05.31 දින වන විට හඳුනාගෙන ඇති නායයෑම් අධි අවදානම් කලාපවල පදිංචි පවුල් එම ස්ථානවලින් ඉවත් කර සුරක්ෂිත ස්ථානවල පදිංචි කරවීම සඳහා අමප/17/1216/715/017 දරණ හා 2017.06.27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාගන්නා ලදී.

ඒ අනුව නායයෑම් හේතුවෙන් සිදුවන ජීවිත හානි අවම කරගැනීම සඳහා අධි අවදානම් කලාපවල සිටින පවුල් විකල්ප ස්ථානවල පදිංචි කිරීම පහත සඳහන් විකල්ප අවස්ථා 03 යටතේ දිස්ත්‍රික් ලේකම්වරුන් ගේ අධීක්ෂණය මත සිදු කරනු ලබන අතර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හා අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් සිදු කරනු ලබයි. මෙම වැඩසටහන 2018 වර්ෂයේ රත්නපුර, කෑගල්ල, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, මහනුවර, නුවරඑළිය, මාතලේ යන දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක වෙමින් පවතී.

- **ඉඩමක් සමඟ නිවසක් මිලදී ගැනීමට රුපියල් මිලියන 1.6ක් ලබාදීම.**
- **ඉඩමක් මිලදී ගෙන නිවස ඉදිකිරීම සඳහා ඉඩම සඳහා රුපියල් මිලියන 0.4ක් හා නිවස ඉදිකිරීමට රුපියල් මිලියන 1.2ක් ලබාදීම.**
- **රජයේ ඉඩමක නිවස ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 1.2ක් ලබාදීම.**

2018 වර්ෂයේදී නැවත පදිංචි කිරීම් සඳහා රුපියල් මිලියන 1845.24 ක ප්‍රතිපාදන රජය මගින් වෙන්කරන ලදි. එම ප්‍රතිපාදන නව නිවාස ඉදිකිරීමට හා නිවාස ඉදිකිරීම සඳහා යොදා ගන්නා ඉඩම්වල යටිතල පහසුකම් සංවර්ධනයට පහත පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දී ඇත. 2018.12.31 දිනට එහි වියදම රුපියල් මිලියන 1578.83 කි.

| දිස්ත්‍රික්කය | ප්‍රතිපාදන ප්‍රමාණය | වියදම රු. |
|---|---|---|
| කොළඹ | 1,600,000.00 | 900,000.00 |
| ගම්පහ | 7,990,000.00 | 7,990,000.00 |
| කළුතර | 504,886,942.71 | 437,934,938.40 |
| මහනුවර | 46,831,555.56 | 44,029,964.88 |
| මාතලේ | 23,600,000.00 | 23,500,000.00 |
| නුවරඑළිය | 23,000,000.00 | 2,000,000.00 |
| ගාල්ල | 229,251,247.40 | 191,064,252.97 |
| මාතර | 271,575,388.94 | 257,063,627.11 |
| හම්බන්තොට | 42,122,517.00 | 39,702,655.00 |
| අම්පාර | 1,000,000.00 | 1,000,000.00 |
| කුරුණෑගල | 1,200,000.00 | 500,000.00 |
| අනුරාධපුර | 1,600,000.00 | 186,644.88 |
| බදුල්ල | 22,900,000.00 | 7,900,000.00 |
| රත්නපුර | 548,255,404.53 | 471,116,229.66 |
| කෑගල්ල | 119,428,009.55 | 88,245,847.88 |
| ප්‍රධාන කාර්යාලය | | 5,703,687.90 |
| එකතුව | 1,845,241,065.69 | 1,578,837,848.68 |

මෙම දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක වන නැවත පදිංචි කිරීමේ වැඩසටහන සඳහා පවුල් 4,678 ක් ඇතුලත්ව අති අතර ඔවුන් අතරින් පවුල් 1,765 ක නිවාස ඉදිකරමින් පවතී. ඉදිකර අවසන් නිවාස ගණන 110කි.

### 2016 වර්ෂයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ආරම්භ වූ නැවත පදිංචි කිරීමේ වැඩසටහනෙහි නිවාස ඉදිකිරීම් ප්‍රගතිය

2016 වර්ෂයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සිදු වූ නායයෑම් හා නායයෑමේ අධි අවදානම හේතුවෙන් තම පදිංචි ස්ථානයන්ගෙන් ඉවත් කරනු ලබන පවුල් 2039ක් නැවත පදිංචි කිරීම සිදුකරන අතර 2018 වර්ෂයේදී ඒ සඳහා රුපියල් මිලියන 800ක ප්‍රතිපාදන රජය මගින් වෙන්කරන ලදි. එම ප්‍රතිපාදනයෙන් මේවන විට රුපියල් මිලියන 643.74ක් කෑගල්ල දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී ඇති අතර 2018.12.31 දිනට වියදම රුපියල් මිලියන 385.88කි.

| | |
|---|---|
| අධි අවදානම් පවුල් ගණන | 2039 |
| නිවාස ලබා දිය යුතුව තිබූ පවුල් ගණන | 1682 |
| ස්ව කැමැත්තෙන් නිවාස යොජනා ක්‍රමයෙන් ඉවත්වන පවුල් ගණන | 320 |
| භූමිය ස්ථාවරකර නැවත පදිංචිය සිදුවන පවුල් ගණන | 37 |

| | |
|---|---|
| සම්පූර්ණ නිවාස ඉදිකර නැවත පදිංචිය සිදුකර ඇති පවුල් ගණන | 1475 |
| අර්ධ වශයෙන් නිවාස ඉදිකර නැවත පදිංචිය සිදුකර ඇති පවුල් ගණන | 153 |
| පදිංචි කර ඇති මුළු පවුල් ගණන | 1628 |

තවත් නිවාස 64 ඉදිකිරීම් කටයුතු මේ වන විට සිදුකරමින් පවතී

## 8. **106-2-4-7-1508** වැය විෂය යටතේ සාලාව යුධ හමුදා කඳවුරේ අවි ගබඩාව පිපිරීමෙන් ආපදාවට පත්වූ පුද්ගලයන් සඳහා සහන සැලසීම

සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ කොස්ගම, සාලාව යුධ හමුදා කඳවුරේ 2016.06.05. දින ප.ව. 5.45 ට පමණ ඇතිවූ පිපිරීමෙන් සිවිල් ජීවිත වලට හානි සිදු නොවූවද ඒ අවට ප්‍රදේශයේ නිවාස, ව්‍යාපාරික ස්ථාන, චංචල හා නිශ්චල දේපල ඇතුළු වෙනත් සම්පත් හානියට පත් විය.සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තොරතුරු වලට අනුව පූර්ණ නිවාස හානි හා ව්‍යාපාරික ස්ථාන හානි 161ක් වාර්තා වූ අතර අර්ධ නිවාස හානි 345කි. තවද සුළු නිවාස හානි 1,322ක් ද වාර්තා විය. වන්දි ලබාදීම සඳහා දේපල තක්සේරු කිරීම වෙනුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුව සහයෝගය ලබාදුන් අතර අනෙකුත් සහන සැලසීමේ කටයුතු සියල්ල ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,ශ්‍රී ලංකා යුධ හමුදාව,පොලිස් දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සභාව වැනි රාජ්‍ය ආයතන සමග ලබාගෙන සිදු කරන ලදී.

ඒ අනුව නිවාස හානි හා දේපල හානි වන්දි ලබාදීම වෙනුවෙන් 2018 වර්ෂයේ භාණ්ඩාගාරය මගින් රුපියල් මිලියන 12.6ක ප්‍රතිපාදන මේ වන විට ලබා දී ඇත එම ප්‍රතිපාදන යොදාගනිමින් නිවාස හානි සඳහා රු. 574,250 වියදමක් හා දේපළ හානි වෙනුවෙන් රු. 2,995,750ක වියදම් දරා ඇත.

2018-8-22 දිනැති අංක අපම/18/1764/823/010 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව රථ වාහන හානි සඳහා වන්දි ප්‍රතිලාභීන් 54 දෙනකු වෙත ලබාදීම වෙනුවෙන් රු.8,999,544.30 ක ප්‍රතිපාදන කොළඹ දිස්ත්‍රික් ලේකම් වෙත නිකුත් කරන ලදී.

## 9. **106-2-4-9-1501** වැය විෂය යටතේ මීතොටමුල්ල සන අපද්‍රව්‍ය බහාලුම් ස්ථානය නායයෑමෙන් සිදු වූ ආපදාවෙන් විපතට පත්වූවන්ට සහන සැලසීම

කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මීතොටමුල්ල දහම්පුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කසළ කන්දෙහි දකුණු ප්‍රදේශය 2017.04.14 දින සවස 3.00ට පමණ නාය යෑමට ලක්විණි. එම හදිසි ආපදා තත්ත්වයෙන්
පුද්ගලයන් 33 දෙනෙකු මරණයට පත්වූ අතර, නිවාස හානි 111ක් වාර්තා විය. අවදානම් කලාපයෙන් ඉවත් කරන ලද නිවාස ගණන 163 කි. හානියට පත්වූ නිවාස හා අවදානම් කලාපයෙන් ඉවත් කරන ලද නිවාස හිමි නිවාසලාභීන් 98 දෙනෙකු සඳහා පළමු හා දෙවන අදියරේ දී ද නිවාසලාභීන් 72 දෙනෙකු සඳහා තෙවන අදියරේ දී ද මේ වන විට ඉදිකරන ලද නිවාස 170 ක් ලබාදීමට කටයුතු කර ඇත.

තක්සේරු කරන ලද වටිනාකම් අනුව 2018-**12**-31 දිනට ප්‍රතිලාභීන් 14 දෙනෙකු සඳහා රු.**46,941,000.00** ක නිවාස වන්දි ගෙවීම් සිදුකරන ලදි.

**පෞද්ගලික ඉඩම් සඳහා වන්දි ලබාදීම**

තක්සේරු කළ යුතු මුලු ඉඩම් කැබලි සංඛ්‍යාව 112 කි. ඉන් 108 ක තක්සේරු වාර්තා ලැබී ඇත. එම ඉඩම් කැබලි අතුරින් ප්‍රතිලාභීන් 98 ක් සඳහා රු.707,745,364.00 වන්දි ලබා දී ඇත.

## 10. **106-2-4-13-2202** වැයවිෂය යටතේ සුරක්ෂිත මධ්‍යස්ථාන ඉදිකිරීම

**ස්වභාවික ආපදාවන්ගෙන් විපතට පත්වන ජනතාවගේ සංඛ්‍යාව ක්‍රමිකව ඉහළ යමින් පවතී. ජනතාවට සිදුවන අපහසුතාවයන් අවම කරමින් ඊට සාර්ථකව මුහුණ දීම සඳහා නිරන්තරවම ආපදාවන්ට මුහුණ පාන ප්‍රදේශයන්හි දිස්ත්‍රික් මට්ටමින් තෝරාගත් සුරක්ෂිත මධ්‍යස්ථාන කිහිපයක**

**සනීපාරක්ෂක හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2018 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන ලබා දීම සිදුකරන ලදි.**

**එම ප්‍රතිපාදන යොදාගනිමින් 2018-12-31 දිනට සිදුකල සුරක්ෂිත මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීමේ ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත.**

**සුරක්ෂිත මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීමේ ප්‍රගතිය - 2018.12.31** දිනට

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ කොට්ඨාස ගණන | මධ්‍යස්ථාන සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 9 | 12 | 1,093,288.78 | 100% |
| 2 | ගම්පහ | 3 | 6 | 7,948,217.78 | 100% |
| 3 | කළුතර | 9 | 14 | 9,185,000.00 | 100% |
| 4 | නුවරඑළිය | 1 | 1 | 477,219.83 | 100% |
| 5 | ගාල්ල | 7 | 11 | 9,703,174.61 | 100% |
| 6 | මාතර | 9 | 9 | 9,000,000.00 | 100% |
| 7 | රත්නපුර | 5 | 12 | 5,685,299.10 | 100% |
| 8 | කෑගල්ල | 7 | 10 | 7,875,595.00 | 100% |
| 9 | පොළොන්නරුව | 5 | 10 | 3,495,707.92 | 100% |
| 10 | බදුල්ල | 7 | 8 | 5,600,273.00 | 100% |
| 11 | අනුරාධපුර | 9 | 10 | 9,067,644.27 | 100% |
| 12 | පුත්තලම | 3 | 6 | 2,807,232.95 | 100% |
| 13 | කිළිනොච්චි | 1 | 5 | 1,148,956.00 | 100% |
| 14 | මඩකලපුව | 5 | 6 | 4,190,028.20 | 100% |
| 15 | මහනුවර | 6 | 10 | 6,290,365.00 | 100% |
| 16 | හම්බන්තොට | 2 | 3 | 1,019,488.49 | 100% |
| 17 | වවුනියාව | 4 | 15 | 5,575,466.00 | 100% |
| 18 | ත්‍රිකුණාමලය | 9 | 11 | 6,450,144.02 | 100% |
| 19 | යාපනය | 4 | 4 | 4,000,000.00 | 100% |
| 20 | අම්පාර | 1 | 1 | 1,386,899.00 | 100% |
| | එකතුව | 106 | 164 | 101,999,999.95 | |

## 11. 106-2-4-2401 වැය විෂය යටතේ පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගෙන් හා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත ආපදා සහන සේවා නිලධාරීන්ගේ දැනුම,ආකල්ප, හා කුසලතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවත්වීමට 2018 අයවැයෙන් රුපියල් මිලියන 1.5 ක ප්‍රතිපාදන වෙන් වූ අතර එම ප්‍රතිපාදන යොදාගනිමින් 2018.12.31 දක්වා සහන සේවා නිලධාරීන් 60 දෙනකු සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුහුණු වැඩසටහන් 01 ක් පවත්වා ඇත. ඊට අමතරව දිස්ත්‍රික් නිලධාරී ප්‍රගති සමාලෝචන හා ධාරිතා සංවර්ධන වැඩසටහන් 07ක් නිලධාරීන් 225 ක් සඳහා පවත්වා ඇත. සහන සේවා නිලධාරීන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු හා වාර්ෂිකව විවිධ ආයතන මගින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා ද මෙමෙ වැය විෂය යටතේ 2018/12/31 දිනට රු. 356,145.00 වියදම් දරා ඇත.

## 12. ඉදිරි සැලසුම්

1. ඉදිරියේ දි ඇතිවිය හැකි ආපදා තත්ත්වයන්ට මුහුණ දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ආපදා සහන සේවා සඳහා වූ පෙර සූදානම් වීම සඳහා සැලසුම් කිරීම වෙනුවෙන් "ආපදා සහන සේවා පෙර සූදානම් වීම සහ ප්‍රතිචාර දැක්වීම පිළිබඳ සැලැස්ම" මේ වන විට සකස් කරමින් පවති.

2. "ආපදා සහන සේවා පෙර සූදානම් වීම සහ ප්‍රතිචාර දැක්වීම පිළිබඳ සැලැස්ම" හා නිවාස හානි අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා තොරතුරු ඇතුළත් කිරීම ට සකස් කරන ලද පරිගණක දත්ත පද්ධති වල වැඩකටයුතු අවසන් කිරීම හා එය යාවත්කාලීන කිරීම.

3. සහන සේවා සම්බන්ධ තොරතුරු සම්බන්ධීකරණය කිරීම සඳහා ස්ථාපිත සහන මෘදුකාංගය ICTA ආයතනය (Information Communication Technology Agency) හා සම්බන්ධවෙමින් යථාවත්කාලීන කිරීම හෝ වෙනත් එවැනි මෘදුකාංගයක් නිර්මාණය කිරීම.

4. එම මෘදුකාංගය හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සහන ලබා දීමට අවශ්‍ය තොරතුරු ලබාගැනීමත් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් ප්‍රතිපාදන ලබා දීම හා අනෙකුත් සහන කටයුතු සිදුකිරීමටත් සැලසුම් කර ඇත.

5. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක කරන ජාතික ස්වභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහනෙහි රක්ෂණ වන්දි ලබා දීම කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍යවන ක්රියාමාර්ග ඉදිරි වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

6. මෙහි දී නිවාස හානි තක්සේරු කටයුතුවල නිරත ආපදා සහන සේවා නිලධාරීන්ට හා තාක්ෂණික නිලධාරීන්ට ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. තව ද නිවාස හානි තක්සේරු කිරීමේ පිරිවිතර 2019 වර්ෂය සඳහා සංශෝධනය කිරීමට ද අපේක්ෂිතය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ඩීඑම්ජී/ඒ/එම්ඩීඑම්/එෆ්එස්/2018 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2019 මැයි 31 දින.

ලේකම්
රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

**ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 විගණන මතය

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරන විගණන වාර්තාව 2019 මැයි 31 දින නිකුත් කර ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කල යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකශන සම්බන්ධයෙන් මාගේ වගකීම යන වගන්තිය තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තිය විනිශ්වය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 06 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේත 04 ක් යටතේ එකතුව රු. මිලියන186.43 ක් වූ ආදායම් රැස්කර තිබුණි. ප්‍රධාන ගණන්දීමේ නිලධාරී ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු වශයෙන් නම් කර නොතිබුණු බැවින් එම සංඛ්‍යාව ආදායම් නොවන ලැබීම් යටතේ දක්වනු වෙනුවට ආදායම් ලැබීම් වශයෙන් දක්වා තිබුණි.

(ආ) මාසික ගිණුම් සාරාංශ අනුව භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.මිලියන 1,412.40 වුවද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට අනුව එම සංඛ්‍යාව රු.මිලියන 1,327.40 ක් ලෙස දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මාසයේ මාසික ගිණුම් සාරාංශයේ වූ රු. මිලියන85.00 ක් වූ ප්‍රේෂණ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රේෂණ යටතේ සඳහන් නොකර අග්‍රිම වලින් අඩුකර දක්වා තිබීම හේතුවෙන් මෙම වෙනස ඇති වී තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම්**

මූල්‍ය ප්‍රකාශන සමග ආදායම් ගිණුමක් ඉදිරිපත් කර තිබුණද ප්‍රධාන ගණන්දීමේ නිලධාරී ආදායම් ගණන්දීමේ නිලධාරී ලෙසද නම්කර නොතිබුණ බැවින් මූල්‍ය ප්‍රකාශන සමග ආදායම් ගිණුමක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොවීය.

**2.2 වියදම් කළමණාකරණය**

(අ) මනා අධ්‍යනයකින් තොරව ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් වැය විෂයයන් 13 ක රු. මිලියන 1,121.30 ක ප්‍රතිපාදන සියයට 40 සිට සියයට 94 දක්වා පරාසයක් තුළ ඉතිරිවී තිබුණ බවද මනා අධ්‍යනයකින් තොරව ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් ඇස්තමේන්තු වටිනාකමින් සියයට 35 සිට සියයට 325 දක්වා පරාසයක් තුළ මාරු කිරීම් සිදු කර තිබුණි.

(ආ) මුල්‍ය ප්‍රකාශන වල රු.550,818 ක බැරකම් අඩුවෙන් සටහන් කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

2017 ජුලි 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2016(11) අනුව ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රක්ෂණ ප්‍රතිලාභ ලබා දීම සඳහා ආපදා හානි සම්බන්ධ තක්සේරු වාර්තා හා අනෙකුත් සියලු විස්තර ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් මගින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ඉදිරිපත් කිරීම වෙනුවට අදාළ තක්සේරු වාර්තා හා අනෙකුත් සියලු විස්තර අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සෘජුව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යැවිය යුතු බවත් එම තොරතුරු පදනම් කරගෙන ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අදාළ රක්ෂණ ප්‍රතිලාභ නිදහස් කිරීම සිදුකළ යුතු බවට උපදෙස් දී තිබුණි. මේ හේතුවෙන් ස්වභාවික ආපදා වෙනුවෙන් වන්දි ගෙවීම සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ විෂය පථය සීමාවී තිබුණි.

### 3.2 ප්‍රසම්පාදනයන්

සමාලෝචිත වර්ෂය තුලදී අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදනය කර තිබුණු ජල ටැංකි ජල පොම්ප සහ තාපෝලීන් ෂීට් යනාදියේ ලංසු කැඳවීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සිදු කළ විගණනයන් වලදී ජාතික තරඟකාරී පදනම මත ලංසු කැඳවා නොතිබීම, කාර්ය සාධන සුරක්ෂණයක් ලබා නොගෙන කොන්ත්‍රාත් පිරිනැමීම, සහ තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වී තිබීම වැනි පොදු අඩුපාඩු නිරීක්ෂණය විය. 2018 දෙසැම්බර් 31 දින වන විට ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත සපයා නොතිබුණු ජල පොම්ප 175 ක් වෙනුවෙන් රු. මිලියන 21.44 ක් ගෙවීම සඳහා සහ තාපෝලීන් ෂීට් 2500 ක් වෙනුවෙන් රු.මිලියන 24.99 ක් ගෙවීම් සඳහා සැපයුම්කරුවන්ගේ නමින් ලියා තිබුණු චෙක් පත් අත රඳවාගෙන තිබුණු බව විගණනයේදී වැඩි දුරටත් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් සිදුකල පැහැදිලි කිරීම අනුව තාපොලින් ෂීට් විශාල තොගයක් භාවිතයට ගැනීමට සුදුසු ලෙස සකස්කර කඩිනමින් සැපයීම තෝරාගත් සැපයුම්කරුට අමතර කටයුත්තක් වූ බවත් ඒ අනුව කඩින්කඩ සැපයූ තොග සඳහා මුදල් ගෙවීමේ අරමුණින් චෙක්පත් අත රඳවාගෙන තිබුණි.

### 3.3 කළමණාකරණ දුර්වලතා

(අ) කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක 2017 වර්ෂය තුල සිදුවූ ගංවතුර, නායයාම සහ නායයෑමේ අධි අවදානම් හේතුවෙන් ඉවත් කිරීමට හඳුනාගෙන තිබූ පවුල් 1,444 අතරින් පවුල් 699 ක් නැවත පදිංචි කිරීම සඳහා 2017 වර්ෂයේ රු.මිලියන 188.93 ද 2018 වර්ෂයේ රු.මිලියන 435.46 ක් ද වශයෙන් රු.මිලියන 624.39 ක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වලින් කළුතර දිස්ත්‍රික් ලේකම් විසින් වැයකර තිබුණි.අමාත්‍යාංශය විසින් නිකුත්කර තිබූ මාර්ගෝපදේශයට අනුව නැවත පදිංචිකිරීමේ ප්‍රතිලාභීන්, තෝරාගෙන ලියාපදිංචිකර තිබූ නමුත් ඔවුන්ට නැවත පදිංචි කිරීමේ විකල්ප අවස්ථා තෝරා ගැනීමට නිශ්චිත කාලයක් ලබාදී නොතිබුණි.අදාල ප්‍රතිලාභී ලැයිස්තුව දින 07 ක කාලයක් මහජනතාව සඳහා ප්‍රදර්ශනය කළයුතු වුවත් එවැනි මහජන ප්‍රදර්ශනයක් කළබවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.රජයේ ඉඩමක,ප්‍රතිලාභීන් සතු ඉඩමක සහ රජයේ මූල්‍යාධාර මත ප්‍රතිලාභීන් මිලට ගත් ඉඩමක රජයේ මූල්‍යාධාර වලින් ඉදිකිරීමට ලබාදුන් රු.මිලියන 121.20 අතරින් රු.මිලියන 33.40 ක් වැයකර ඉදිකිරීම් ආරම්භකර තිබූ නිවාස 167 ක් 2018 දෙසැම්බර් වනවිට අත්තිවාරමට පමණක් සීමාවී තිබුණි.

(ආ) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අවදානම් සහිත ප්‍රදේශවල ජීවත්වන පවුල් 312 ක් හඳුනාගෙන තිබුණු අතර ඔවුන් සඳහා නිවාස තැනීම ආරම්භකර තිබුනේ ප්‍රතිලාභීන් 150 දෙනෙකු සඳහා පමණි. ප්‍රතිලාභීන් 97 දෙනෙකු නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් 02 ක් හඳුනාගෙන තිබුණු අතර විගණිත දිනය වූ 2019 මාර්තු 28 දින වන විටත් එම කටයුතු අවසන් වී නොතිබුණි. අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැවත පදිංචි කිරීම සඳහා පවුල් 264 ක් හඳුනාගෙන තිබුනු අතර ඉඩම් කට්ටි හඳුනාගෙන නිවාස ඉදිකිරීම 2018 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර තිබුණේ පවුල්151 ක් පමණි. විගණිත දිනය වූ 2019 අප්‍රේල් 02 දින වන විට ඉතිරි පවුල්113 සඳහා ඉඩම් හඳුනා ගැනීම පමණක් සිදු කර තිබුණි.

(ඇ) ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ මත මහනුවර දිස්ත්‍රික්කයේ අධි අවදානම් කලාපවල ජීවත්වන වතු පවුල් හා වතු නොවන පවුල් 2,098 ක් හඳුනාගෙන තිබුණි. එම පවුල් සඳහා ස්ථිර නිවාස ඉදිකිරීම වෙනුවෙන් හඳුනාගත් පවුල් 328 ක් සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් වෙත රු. මිලියන 93.30 ක ප්‍රතිපාදන ප්‍රේෂණය කර තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 50.80 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත ආපසු ප්‍රේෂණය කර තිබුණි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්තාවට අනුව දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල අධි අවදානම් සහිත වතු නොවන නිවාස 24 ක හා වතු නිවාස 25 ක ජීවත්වන පවුල් නැවත පදිංචි කිරීමට යෝජිත වුවත් 2019 මාර්තු 22 වන විටත් අධි අවදානම් කලාපවලින් ඉවත් කර කිසිදු පවුලක් නැවත පදිංචි කර නොතිබුණි. මේ සඳහා 2016 වර්ෂයේදී හඳුනාගත් ලෝරාවත්ත නැමැති රජයේ ඉඩමෙහි පුද්ගලයින් නැවත පදිංචි කිරීමට යෝග්‍ය බව පිළිබඳව ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් පරස්පර නිර්දේශයන් ලබා දීම හේතුවෙන් එම ඉඩමේ පුද්ගලයින් නැවත පදිංචි කරවීමට නොහැකි වී තිබුණි. ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල 2016 වර්ෂයේ කුරුඳුවත්ත ප්‍රදේශයේ ඇති වූ නායයෑම් තත්ත්වයන් හේතුවෙන් අධි අවදානම් කලාප ලෙස හඳුනාගත් බෙරවිල ප්‍රදේශයේ පවුල් 162 ක් පදිංචි කරවීම සඳහා කුරුඳුවත්ත නගරයට ආසන්න අක්කර 25 ක පෞද්ගලික ඉඩමක් තෝරාගෙන නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා රු. මිලියන 35.40 ක ප්‍රතිපාදන මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබුණි. ඒ අනුව නිවාස ඉදි කර ගැනීම සඳහා පවුල් 153 ක් සඳහා 2018 නොවැම්බර් 16 දින රු. මිලියන 30.60 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් 2019 අප්‍රේල් 08 දින වන විට ඉන් පවුල් 125 ක් කිසිදු නිවාස ඉදි කිරීමක් නොකර අධි අවදානම් කලාප වලම සිටි බව නිරීක්ෂණය විය. උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නායයෑම් අධි අවදානම් කලාපවල ජීවත් වන වතු පවුල් 99 ක් හා වතු නොවන පවුල් 13 ක් හඳුනාගෙන තිබුණ අතර නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා රු. මිලියන 30.80 ප්‍රතිපාදනය මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙත ප්‍රේෂණය කර තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල උපයෝජනය කර නොතිබුණි.

උක්ත ඡේදවල ඇතුලත් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් සිදුකල පැහැදිලි කිරීම් අනුව නායයෑම් අධි අවදානම් කලාප වල ජීවත් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා නායයෑම් අවදානම් රහිත පදිංචියට සුදුසු ඉඩම් එම දිස්ත්‍රික්ක වලින් සොයාගැනීම අමතර කාර්යයක් වී තිබුණි.තවද නායයෑම් අවදානමට මුහුණපා තිබුණු ඉඩම් වලින් ජනතාව ඉවත් කර ගැනීමට පොළඹවා ගැනීම හා තෝරාගත් ඉඩම්වල නැවත පදිංචි කරවීම අභියෝගාත්මක ඉලක්ක වූ බවත් රජය විසින් ලබාදුන් ප්‍රතිලාභ උපයෝජනය සම්බන්ධයෙන් පසු විපරමක් සිදුකිරීමට ප්‍රායෝගිකව දුෂ්කරතා පැවතුණි.

(ඇ) දැඩි වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා නියං සහනාධාර වැඩසටහන අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක 14 ක ප්‍රතිලාභීන් 451,224 ක් හඳුනාගෙන තිබුණු අතර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අත්තිකාරම් වශයෙන් 2018 සැප්තැම්බර් 25 දින රු.මිලියන 700 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රේෂණය තිබුණි. පසුව 2018 ඔක්තෝබර් 09 දින ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත එම ප්‍රතිපාදන නැවත පවරා ගැනීම සඳහා කටයුතු කර තිබුණි. අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි සහනාධාර වැඩ සටහනේ II වන අදියර 2018 සැප්තැම්බර් 20 දින සිට තුන් මසක කාලයක් සඳහා මාසිකව සහනාධාර ලබා දිය යුතු වුවද 2018 දෙසැම්බර් 31 දින වන විටත් පළමු වාරිකයට අදාල සහනාධාර ලබා දී අවසන්කර නොතිබුණි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි පවුල් 123,058 ක් සඳහා නියං සහනාධාර ලබා දීමට කටයුතු කර තිබුණි. දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කිහිපයක සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී ගලෙන්බිඳුනුවැව සහ තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල සහනාධාර සැලසිය යුතු පවුල් 1050 ක් හා 1,971 ක් පිළිවෙලින් හඳුනාගෙන තිබුණු නමුත් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල පිළිවෙළින් පවුල් 11,017 හා 11,084 ක් සඳහා සහානාධාර ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

නියං සහනාධාර සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් සිදුකල පැහැදිලි කිරීම් අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ නියගයෙන් පීඩාවට පත්වූ පවුල් සංඛ්‍යාව පසුකාලීනව ක්‍රමයෙන් වැඩිවී තිබුණු බවත් අදාල සහනාධාර වඩාත් ක්‍රමවත්ව බෙදාහැරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීමට සිදුවීම හේතුවෙන් ඇතැම් ප්‍රමාදයන් සිදුවී තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 වන පරිච්ජේදයේ 2 (අ) පරිදි අමාත්‍යාංශය විසින් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම පිළියෙල කළ යුතු අතර ඒසඳහා එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2017 වර්ෂයේදී රු.මිලියන 02 ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබා දී තිබුණි. ඒ අනුව 2018 - 2030 දක්වා වු කාල පරිච්ජේදය වෙනුවෙන් නව සැලැස්මක් පිළියෙල කිරීම 2018 දෙසැම්බර් 31 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

(ඊ) ජාත්‍යන්තරව පිළිගත් සෙන්දායි රාමුව අනුව, ආපදා අවදානම අවම කිරීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2015 වර්ෂයේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට ලබාදුන් රු. මිලියන 1.30 ක මුදලින් 2017 දෙසැම්බර් 31 දින වන විට මධ්‍යස්ථානය විසින් රු.318,582 ක් වැය කර තිබුණද එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. උක්ත සැලැස්ම සකස් කිරීමේ කටයුතු අමාත්‍යාංශය විසින් ඉටු කළයුතු බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ඉකුත් වර්ෂයේදී විගණනයට දන්වා තිබුණ ද අමාත්‍යාංශය විසින් ද එවැනි සැලැස්මක් පිළියෙල කිරීමට 2018 දෙසැම්බර් 31 දින වන තෙක් කටයුතු කර නොතිබුණි.

**4. තිරසර සංවර්ධනය**

තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතින්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාලව ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී නොතිබුණි

## 5. යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

#### 5.1.1 ආපදා සහන ගිණුම

හදිසි ආපදා තත්වයන්ගෙන් විපතට පත් ජනතාවට සහන සැලසීම සඳහා ආධාර එකතු කිරීම අරමුණු කරගෙන 2016 මැයි 20 දින විවෘත කරතිබුණු බැංකු ගිණුමේ දේශීය හා විදේශීය පරිත්‍යාගශිලීන්ගෙන් ලැබී තිබුණු ආධාර වලින් 2018 අගෝස්තු 06 දින වන විට රු.මිලියන 294.45 ක අරමුදලක් ගොඩනැගී තිබුණි. චීන රජයෙන් ලද ඩොලර් මිලියන 1.00 පරිත්‍යාගයක්ද මීටඇතුලත් විය. කෙසේ වෙතත් මෙම අරමුදල් ආපදා සහන සේවා කටයුතු සඳහා යොදාගැනීමට ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 6. මානව සම්පත් කළමණාකරණය.

අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 113 ක් වුවද 2018 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 78 ක් පැවති අතර ජොෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු සමග පුරප්පාඩු 35 ක් පැවතුණි.

ජී.ඒ.එම්.අයි. ගුණරත්න
නියෝජ්‍ය විගණකාධිපති.
විගණකාධිපති වෙනුවට